# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,508 - 2026 සැප්තැම්බර් මස 25 සිකුරාදා - 2026.09.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස (II අ) වැනි කොටස - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු … … | - | විභාග, විභාග ප්‍රතිඵල ආදිය … … … … … | - |

*සැ.යු.*: (i) ත්‍රස්තවාදයෙන් රාජ්‍යය ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත 2026.09.18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) විසර්ජන පනත් කෙටුම්පත 2026.09.18 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට්* පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 ඔක්තෝබර් මස 16 දින පළකෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 ඔක්තෝබර් මස 02 දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාර දිය යුතුය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."

**ප්‍රසන්න ජයරත්න,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2026 අප්‍රේල් මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

0000 - B 82833 - (2026/09)
E - 01

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

2. සේවා කොන්දේසි - සාමාන්‍ය :

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකි ය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමඟම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

5. යුද්ධ සේවා අනුග්‍රහය

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

*සැ. යු. :*"මින්පෙර පළ වූ ගැසට් නිවේදන සියල්ලෙහි ම සඳහන් විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් යන මැයෙන් පළකරනු ලැබූ නීති හා උපදෙස් මාලාව මෙමගින් අවලංගු කරනු ලබන අතර මින් ඉදිරියේ දී බලපවත්වනු ලබන්නේ මෙම ගැසට් පත්‍රයේ පළකරනු ලබන නීති හා උපදෙස් මාලාවයි."

2026 ජූලි මස 22 වැනි දින,
ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ,
විභාග කොමසාරිස් ජනරාල්.

අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :

"1968 අංක 25 දරන විභාගපනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත''

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

(i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,

(ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,

(iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,

(v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,

(vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාගඅපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. ඊ''

(i)විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii)යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක වක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii)යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

# තනතුරු - ඇබෑර්තු

## රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව

රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ
ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ (PL 3) විවෘත බඳවා ගැනීම් සඳහා අයදුම්පත් කැඳවීම - 2026

**1.0** රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ පහත සඳහන් ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරුවල පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**2.0** රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ බඳවා ගැනීමට නියමිත තනතුරුවල පුරප්පාඩු පහත වගුවෙන් දැක්වේ.

| *අනු. අංකය* | *අනුමත තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|---|
| 1 | කෝරකරු (Core maker) | 01 |
| 2 | පිරිසැකසුම්කරු (ලෝහ) (Fabricator (Metal)) | 02 |
| 3 | උඳුන්කරු (Furnanceman) | 01 |
| 4 | වැද්දුම්කරු (සාමාන්‍ය) (Fitter ( General)) | 08 |
| 5 | බර වාහන ක්‍රියාකරු (Heavy Vehicle Operator ) | 04 |
| 6 | නළ කර්මාන්තකරු (Pipe fitter) | 01 |
| 7 | යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) (Machine Operator (Production)) | 01 |
| 8 | යන්ත්‍රකරු ( Machinist) | 08 |
| 9 | යන්ත්‍රකරු (ලී) (Machinist (Wood)) | 01 |
| 10 | වාත්තුකරු ( Foundry Man) | 04 |
| 11 | වාත්තුමල්කරු (Pattern Maker) | 01 |
| 12 | ජලනළ කාර්මික (Plumber) | 01 |
| 13 | පෑස්සුම්කරු (Welder ) | 05 |
| 14 | දැව කර්මාන්තකරු (දැව භාණ්ඩ) ( Carpenter ( Furniture)) | 01 |
| 15 | **එකතුව** | **39** |

**3.0 වැටුප් පරිමාණය :-**

3.1. **වැටුප් කේත අංකය** - PL 3 - 2025

3.2. **වැටුප් පරිමාණය** - රු. 42,780/- - 10 x 490-10 x 540 -10 x590-12 x 630 = රු. 66,540/-

***සටහන* - I )** රා.ප.ච 10/2025 හි උපලේඛන III අනුව 2027.01.01 දක්වා වැටුප් ගෙවන අතර, 2027.01.01 දින සිට උපලේඛන II අනුව වැටුප් ගෙවීම සිදුකරනු ඇත.

II) මෙම වැටුපට අමතරව පොදුවේ රජයේ නිලධාරීන් වෙත රජය විසින් කලින් කලට ගෙවනු ලබන වෙනත් දීමනා ද ඔබට හිමිවේ.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

3.3 වැටුප් ක්‍රමය : -

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් පියවර* | *ආරම්භක වැටුප් තලය (රු.)* |
|---|---|---|
| III | පියවර 01 | රු. 42,780/- |
| II | පියවර 12 | රු. 48,220/- |
| I | පියවර 22 | රු. 53,670/- |
| විශේෂ | පියවර 32 | රු. 59,610/- |

**4.0** තනතුරෙහි / තනතුරුවල ස්වභාවය : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත
**5.0** බඳවා ගැනීමේ ශ්‍රේණිය : III ශ්‍රේණිය
**6.0** භාෂා මාධ්‍යය : සිංහල/ දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය
**7.0** පැවරෙන කාර්යය භාරය:-

| *අනුමත තනතුරු නාම* | *කාර්යයන්* |
|---|---|
| කෝරකරු (Core maker) | වාත්තු කිරීම් වලදී අවශ්‍ය වන සියලුම ආකාරයේ කෝර සෑදීම, එම කෝර සෑදීම සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| පිරිසැකසුම්කරු (ලෝහ) (Fabricator (Metal)) | රෝහල් සඳහා උපකරණ සෑදීම, තහඩු යොදා ආකෘති සකස් කිරීම, තහඩු වලින් අකුරු කැපීම හා තීන්ත ආලේපන කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| උදුන්කරු (Furnanceman) | සියලු වාත්තු ගැනීමේදී අවශ්‍යවන උදුන් ක්‍රියාත්මක කරවීම හා උදුන් අලුත්වැඩියා කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| වැද්දුම්කරු (සාමාන්‍ය) (Fitter (General)) | සියලු බර/සැහැල්ලු වැද්දුම් කටයුතු කිරීම (විශාල පරිමාණ ගේට්ටු නිෂ්පාදනය) හා යන්ත්‍ර අලුත්වැඩියා කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| බර වාහන ක්‍රියාකරු (Heavy Vehicle Operator) | බර වාහන ක්‍රියාත්මක කරවීම හා එම වාහන වල සුළු සේවා කටයුතු කිරීම. |
| නළ කර්මාන්තකරු (Pipe fitter) | වායු සම්පීඩන යන්ත්‍ර, බොයිලේරු ක්‍රියාත්මක කිරීමේදී හා සුළු නඩත්තු කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) ( Machine Operator ( Production)) | ඇණ සාදන යන්ත්‍රය හා වෙනත් නිෂ්පාදන ක්‍රියාවලි සඳහා වන යන්ත්‍ර ක්‍රියාකරවීම, ඒවායේ සුළු නඩත්තු කටයුතු කිරීම හා එම ක්‍රියාවන් සඳහා ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| යන්ත්‍රකරු (Machinist) | බෝරින් මිලින්, ලේත් හා ඩ්‍රිලින් යන්ත්‍ර ක්‍රියාකරවීම හා එමඟින් ලෝහ කොටස් අවශ්‍ය පරිදි යන්ත්‍රණය කිරීම හා ඒවායේ සුළු සේවා කටයුතු හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| යන්ත්‍රකරු (ලී) (Machinist (Wood)) | වඩු කාර්මික අංශයේ ඇති සියලුම යන්ත්‍ර ක්‍රියාකරවීම හා එම යන්ත්‍රවල සුළු සේවා කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| වාත්තුකරු (Foundry Man) | වාත්තු ගැනීමට අවශ්‍ය වන වාත්තු අච්චු සෑදීම සඳහා ඒවා සූදානම් කිරීම හා වාත්තු ගැනීමේ කටයුතු කිරීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| වාත්තුමල්කරු (Pattern Maker) | වාත්තු අච්චු සෑදීම සඳහා අවශ්‍ය වන වාත්තු මල ලී වලින් සෑදීම හා ඒ සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබා දීම. |
| ජලනළ කාර්මික (Plumber) | P.V.C හා G.I ජලනල පද්ධති සඳහා සවි කිරීම, නාන කාමර සඳහා සනීපාරක්ෂක උපකරණ ඇතුළු අනිකුත් උපාංග සවිකිරීම, ජල සම්පාදනය ක්‍රියාකරවීම හා ඒවායේ සුළු නඩත්තු කටයුතු කිරීම හා එම ක්‍රියාවන් සඳහා ඇස්තමේන්තු විස්තර ලබා දීම. |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *අනුමත තනතුරු නාම* | *කාර්යයන්* |
|---|---|
| පැස්සුම්කරු (Welder) | ගෑස්, විද්‍යුත්, ටිග් සහ මිග් යන්ත්‍ර භාවිතා කරමින් සියලුම පැස්සුම් කටයුතු (පිත්තල , ඇළුමිනියම්, යකඩ චීනච්චට්ටි හා සුදු යකඩ පැස්සුම් කටයුතු කිරීම) මෙම කාර්යන් සඳහා වන ඇස්තමේන්තු විස්තර ලබාදීම. |
| දැව කර්මාන්තකරු ( දැව භාණ්ඩ) (Carpenter ( Furniture)) | ලී වලින් නිෂ්පාදනය කරන සියලුම වර්ගයේ ගෘහ භාණ්ඩ සෑදීම, ඒවා පොලිෂ් කිරීම හා ඉහත භාණ්ඩවල සිදුකරන අලුත්වැඩියාවන් කිරීම හා ඒවාට අදාළ ඇස්තමේන්තු විස්තර ලබා දීම. |

**8.0** **බඳවා ගැනීමේ සුදුසුකම් :-**

**(I).** **අධ්‍යාපන සුදුසුකම් :**

I.අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් 06ක් සමත් වී තිබීම.

II. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 28/2016ට අනුව ක්ෂේත්‍රයට අදාළව NVQ 03 හෝ NVQ 04 වන මට්ටමේ නිපුණතාවයක් ලබා ඇත්නම් අංක I යටතේ සඳහන් කර ඇති අධ්‍යාපන සුදුසුකම් අදාළ නොවේ.

**II).** **වෘත්තීය සුදුසුකම්** : එක් එක් තනතුරෙහි කාර්ය භාරයට අදාළව තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිගමනය කරනු ලැබ ඇති පරිදි ජාතික වෘත්තීය කුසලතාවන්හි ( N.V.Q. ) හතර (04) වන මට්ටමට නොඅඩු නිපුණතාවක් ලබා තිබීම.

**එක් එක් තනතුරට අදාල වෘත්තීය සුදුසුකම් පහතින් දක්වා ඇත.**

| *අනුමත තනතුරු නාම* | *වෘත්තීය සුදුසුකම්* |
|---|---|
| කෝරකරු (Core maker) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර එකක පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතුය.<br>II. විශේෂ වැඩ සඳහා සුදුසු කෝර සැකිලි පැස්සීම හෝ වාත්තු කිරීම පිළිබඳ සැලැසුම් කිරීමේ හැකියාව තිබිය යුතුයි.<br>III. විවිධ ප්‍රමාණයේ වැලි කෝර සහ හැඩ සඳහා වෙන්ටින් සහ බේකින් ක්‍රම පිළිබඳ දැනුම තිබිය යුතුයි.<br>IV. කෝර පස් වැලි මිශ්‍රණයක් සාදාගෙන රැම් කර රේන්පෝස්කර වෙන්ට් ඩිලිවරි සහ ඩ්‍රෙස් කෝර සකස් කර කෝර පෙට්ටියක් සෑදීම.<br>V. ඔයිල් සැන්ඩ් මිශ්‍රණය සෑදීම සහ එමගින් කෝර සෑදීමට හැකි විය යුතු යි.<br>VI. ෆෙරස්/නිෆේරස් වැඩ සඳහා වියළි විශේෂිත/ ග්‍රීන් සැන්ඩ් සහ විශේෂිත වර්ගයේ මැටි කෝර සෑදීමට අවශ්‍ය පස් මිශ්‍රණයක් නියමිත අනුපාතයට සකස් කර ගත හැකි විය යුතු යි.<br>VII. ලෝම් සැන්ඩ් මගින් පයිප්ප කෝර සෑදීම සහ එම මාධ්‍යයේ ම ආධාරක කෝර පෙට්ටි මත හෝ ටෙම්ප්ලේට් ආධාරක යොදාගෙන කෝර සැකිලි සෑදීම කළ හැකි විය යුතු යි.<br>VIII. මෝල්ඩ් සෑදීම පිළිබඳ දැනුමක් සහ නිපුණතාවයෙන් උසස් මෝල්ඩ්කරුවකු වීම. |
| පිරිසැකසුම්කරු (ලෝහ) (Fabricator (Metal)) | NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |

| අනුමත තනතුරු නාම | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| උදුන්කරු (Furnanceman) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර එකක පාඨමාලාවක් හදාරා ඉන් සමත් වී ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳ සහතික ඉදිරිපත් කළ යුතු ය.<br>II. ෆෙරස් සහ නිෆෙරස් අංශවල ඇති විවිධ ලෝහ (ඇලෝයිස්) කොටස් කැඩීමෙන් හෝ අනිකුත් ක්‍රම මගින් හඳුනා ගත හැකි විය යුතු යි.<br>III. නන්ෆෙරස් ෆර්නස්, ක්‍රුසිබල්ස්, ක්‍රුසිබල් නොවන, ඔයිල් ෆයර්ඩ් ෆර්නස් සහ කියුපෝලා ක්‍රියා කරවීමට සහ අළුත්වැඩියා නඩත්තු කටයුතු කළ හැකි විය යුතු යි.<br>IV. කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්ස්, බර්නර්ස්, ඔසවන සහ අමුද්‍රව්‍ය ඇතුළත් කරන උපකරණ, සහ බර කිරන සියලුම යන්ත්‍ර ක්‍රියා කරවිය හැකි විය යුතු යි.<br>V. ද්‍රාවණය කරන ලද ලෝහයේ උෂ්ණත්වය මැනීම සඳහා ෆයිරො මීටරයක් භාවිත කිරීමට මූලික දැනීමක් තිබිය යුතු යි.<br>VI. ෆෙරස්/ නිෆෙරස් උණුකිරීම් වලදී යොදා ගන්නා කියුපෝලා/ උදුන්වලින් ටැප් කර ලබා ගන්නා ලෝහ ද්‍රාවණය හෝ ඉන්ධන සහ වාතයේ මිශ්‍රණ අනුපාතවලට අනුව පිටවන දුම පරීක්ෂා කිරීමෙන් ද්‍රවණය වෙමින් ඇති ලෝහයේ තාපය පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතු ය.<br>VII. උණුකිරීම් වලට යොදා ගන්නා ඉන්ධන සහ ලෝහ අතර අනුපාත ගැන දැන ගත යුතුවන අතර වඩා ආර්ථික වශයෙන් ඵලදායී මට්ටම් මොනවාද යන්න දැන සිටිය යුතු යි. |
| වැද්දුම්කරු (සාමාන්‍ය) Fitter (General) | NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| බර වාහන ක්‍රියාකරු (Heavy Vehicle Operator) | I. බර වාහන ක්‍රියා කරවීම සම්බන්ධයෙන් අවම වශයෙන් වසර (10) දහයක පිළිගත් ලියාපදිංචි ආයතනයක පළපුරුද්දක් ලබා තිබිය යුතු යි.<br>II. බර වාහන වල නඩත්තුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා තිබිය යුතු යි.<br>III. ප්‍රයිම් මූවර් ටෙලර් ක්‍රියාකරවිය හැකි විය යුතු යි.<br>IV. ක්‍රේන් යන්ත්‍රයක් ක්‍රියාකරවිය හැකි විය යුතු යි.<br>V. ලොරි සහ ෆෝක්ලිෆ්ට් ( Forklift ) ක්‍රියාකරවිය හැකි විය යුතු යි.<br>VI. NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| නළ කර්මාන්තකරු (Pipe fitter) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා තිබීම සහ පහත සඳහන් වෘත්තීය සුදුසුකම් ලබා ඇති බවට සහතිකයක් ඉදිරිපත් කළ යුතු ය.<br>II. වෘත්තීයට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. උණුසුම් සහ සීතල ජල සැපයුම් නල සවි කිරීම සහ නඩත්තුව<br>IV. මල අපද්‍රව්‍ය පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>V. චිල් වෝටර් (Chil Water) නළ සවි කිරීම සහ නඩත්තුව<br>VI. වාෂ්ප පයිප්ප පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>VII. සම්පීඩන වායු නළ පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>VIII. ගිනි නිවන උපකරණ සහ උපාංග සවි කිරීම සහ නඩත්තු කිරීම<br>IX. පොම්ප සවි කිරීම සහ නඩත්තුව |
| යන්ත්‍ර ක්‍රියාකරු (නිෂ්පාදන) ( Machine Operator ( Production)) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය හා පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු ය .<br>II. වෘත්තීයට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. බෝල්ට් හැඩ තලන යන්ත්‍රය ක්‍රියාකරවිය යුතු යි<br>IV. ද්‍රව පීඩක යන්ත්‍ර ක්‍රියාකරවීම<br>V. කම්මල් හැඩ තලන යන්ත්‍ර සහ පීඩක ක්‍රියාකරවීම<br>VI. යන්ත්‍රයේ වේගය පාලනය කිරීම සඳහා සීරුමාරු කිරීම<br>VII. නිෂ්පාදන යන්ත්‍ර ක්‍රියාකරවීම සහ නඩත්තුව<br>VIII. නිෂ්පාදනවල පිරිවිතර පරීක්ෂා කිරීම නිෂ්පාදන වාර්තා සැකසීම |
| යන්ත්‍රකරු( Machinist) | NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |

Gazette.lk AMBITIONS REALIZED

| අනුමත තනතුරු නාම | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| යන්ත්‍රකරු (ලී) (Machinist (Wood)) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු ය.<br>II. වෘත්තියට අදාළ ආයුධ සහ යන්ත්‍ර නඩත්තුව පිළිබඳ මනා දැනුමක් තිබිය යුතු යි.<br>III. වෘත්තියට අදාළ මූලික දැනුම සහ මූලධර්ම ගැන දැනුමක් තිබිය යුතු යි.<br>IV. සැලසුමක් කියවීමට හැකි විය යුතු යි.<br>V. පහත සඳහන් යන්ත්‍රන මැෂින් (f) ද ඇතුළත්ව අවම වශයෙන් 05ක් ඉතා කෙටි කාලයකින් ක්‍රියා කරවිය හැකි විය යුතු යි.<br>a) මෝටයිසින් යන්ත්‍රය ( Mortising Machine )<br>b) ටොනොනින් යන්ත්‍රය ( Tennoning Machine )<br>c) සරල මෝල්ඩින් යන්ත්‍රය<br>d) සැන්ඩින් යන්ත්‍රය<br>e) දැව ලියවීමේ යන්ත්‍රය<br>f) මට්ටම සහ ඝණකම ගෑමේ යන්ත්‍රය |
| වාත්තුකරු (Foundry Man) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් වසර දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු ය.<br>II. ෆෙරස් සහ නිෆෙරස් වාත්තු සඳහා අමු පස්, වියළි සහ ලෝම් සහිත මිශ්‍රණයේ සංයුතිය තීරණය කර අදාළ අමුද්‍රව්‍ය වලට උචිත වන අයුරු අදාළ වාත්තු ලබා ගැනීමට අච්චු මට්ටම් කටු යොදා කළ හැකි විය යුතු යි.<br>III. ෆෙරස් සහ නිෆෙරස් මාධ්‍ය වල විවිධ කෝර වාත්තු අච්චු සාර්ථකව සෑදීමට හැකිවිය යුතු යි.<br>IV. ලෝම් පස්වලින් හැඩමල් වාත්තු අච්චු සෑදීම සඳහා දැනුමක් තිබිය යුතු යි.<br>V. දැනට ඇති අමුද්‍රව්‍ය යොදා ගෙන විශේෂ වැඩ සඳහා සහ සාමාන්‍යයෙන් භාවිතයට ගන්නා මොල්ඩින් පෙට්ටි රාමු, ඔසවනයන් සහ යටිබල පිරි සකස් කර වැඩි දියුණු කර ආර්ථික ඵලදායී ලෙස යොදා ගත හැකි විය යුතු යි.<br>VI. උණු කරන ලද ලෝහය සාමාන්‍යයෙන් පරීක්ෂා කර බලා එම ලෝහය වාත්තු අච්චු වලට වක් කිරීමට සුදුසු අවස්ථාව තීරණය කර ආධාරකරුවන් සහ ලැඩලය ක්‍රියාකරවන්නන් මෙහෙයවා වාත්තු ලබාගැනීමට හැකිවිය යුතු යි.<br>VII. ෆෙරස් සහ නිෆෙරස් වාත්තුවල දී යොදාගන්නා විලින් තාක්ෂණය පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතු යි.<br>VIII. කෝර සෑදීම පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතු යි. |
| වාත්තුමල්කරු ( Pattern Maker) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් එක් අවුරුදු පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු යි.<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. විවිධ ලෝහ සඳහා කන්ට්‍රැක්ෂන් රූල් භාවිත කිරීමට දැන සිටිය යුතු යි.<br>IV. විවිධ ලෝහ වර්ග ගැන සහ වාත්තු ලබා ගැනීම පිළිබඳ හොඳ දැනුමක් තිබිය යුතු යි.<br>V. කෝර ප්‍රින්ට් භාවිත කිරීමට අදාළ දෙන ලද සැලසුමකට අනුව වාත්තු මලක් සෑදීමට හැකිවිය යුතු යි<br>VI. සියලුම වර්ගවල වාත්තුමල් සෑදීම සහ මෙම වෘත්තියේ යොදාගනු ලබන විවිධ කන්ට්‍රැක්ෂන් පරිමාණ භාවිතාව පිළිබඳ හොඳ අවබෝධයක් තිබිය යුතු යි. |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| අනුමත තනතුරු නාම | වෘත්තීය සුදුසුකම් |
|---|---|
| ජලනළ කාර්මික (Plumber) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් එක් අවුරුදු පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු යි.<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. ගෘහස්ත ජල නළ පද්ධති අලුතින් සවිකිරීම සහ අලුත්වැඩියාව සහ ජල පොම්ප සවි කිරීම පිළිබඳ දැනුම සහ පළපුරුද්ද.<br>IV. මලාපවහන පද්ධති සවි කිරීම පිළිබඳ දැනුම සහ පළපුරුද්ද<br>V. ගෘහස්ත කුණු ජලය සහ අපද්‍රව්‍ය බැහැර කරන පද්ධති සවි කිරීම සහ නඩත්තු කිරීම පිළිබඳ දැනුම සහ පළපුරුද්ද.<br>VI. ඕනෑම වර්ගයේ පයිප්ප සහ උපාංග (වානේ පයිප්ප) සවි කිරීම පිළිබඳ දැනුම සහ පළපුරුද්ද. |
| පෑස්සුම්කරු (Welder) | NVQ හතරවන මට්ටමේ ප්‍රවීණතාවය ලබා තිබීම. |
| දැව කර්මාන්තකරු (Carpenter) (දැව භාණ්ඩ) (Furniture) | I. පිළිගත් කාර්මික ආයතනයකින් අවම වශයෙන් අවුරුදු දෙකක පාඨමාලාවක් හදාරා ලබාගත් සහතිකය සහ පහත සඳහන් වෘත්තීය නිපුණතා හා පළපුරුද්ද පිළිබඳව සහතික ඉදිරිපත් කළ යුතු යි.<br>II. වෘත්තියට අදාළ සැලසුම් කියවා තේරුම් ගත හැකි විය යුතු යි.<br>III. නොයෙකුත් දැව වර්ගවල භාවිතය සහ ගුණාත්මකභාවය පිළිබඳ දැනගත යුතු යි.<br>IV. නොයෙකුත් වර්ගයේ දැව මූට්ටු වර්ග පිළිබඳව සහ ඒවා සෑදීම පිළිබඳ දැන සිටිය යුතු යි.<br>V. දැව භාණ්ඩ සෑදීමට ඇස්තමේන්තු ලබා දිය හැකි විය යුතු යි.<br>VI. දැව බෝඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි.<br>VII. දැව කුට්ටි සහ දැව බෝඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි<br>VIII. යන්ත්‍රණය කර නිමා කරන ලද දැව වලින් සහ දැව බෝඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි.<br>IX. අදාළ සියලුම යන්ත්‍රෝපකරණ නඩත්තුව සහ ආයුධ උපකරණ මුවහත් කිරීම සහ පවර් ටූල් නඩත්තුව කළ හැකි විය යුතු යි. |

**(III). පළපුරුද්ද :** රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර දෙක (02) ක පළපුරුද්ද අමතර සුදුසුකමක් ලෙස සැලකේ.

**(IV). කායික සුදුසුකම් :** සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

**(V).** වෙනත් :

I. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
II. අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
III. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට්* පත්‍රයේ සඳහන් වන 2026.09.25 වන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**9.0 වයස** : අයදුම්පත් කැඳවන අවසන් දිනට අවු. 18 ට නොඅඩු හා අවු. 45 ට නොවැඩි විය යුතු ය.

**10.0 බඳවා ගැනීමේ ක්‍රමය :** වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණයක හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ.

**10.1.1.** වෘත්තීය ප්‍රායෝගික පරීක්ෂණය

| තනතුරු නාමය | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| **කෝරකරු (Core maker )** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** කෝර පස් වැලි මිශ්‍රණයක් සාදාගෙන රැම් කර රේන්පෝස්කර වෙන්ට් ඩිලිවරි සහ ඩ්‍රෙස් කෝර සකස් කර කෝර පෙට්ටියක් සෑදීම.<br>**b)** ෆෙරස්/නිෆෙරස් වැඩ සඳහා අවශ්‍ය කෝර වැලි ගම් සහ ඩ්‍රෙසින් මිශ්‍රණයේ සංයුතිය නිවැරදිව යොදා ගෙන කෝර වැලි මිශ්‍රණය සාදා ගැනීම.<br>**c)** විශේෂිත වැඩ සංකීර්ණ සහ කෝර කිහිපයක් ඇති වැඩ, පැකින් බ්ලොක් සඳහා කෝර සෙට් කිරීමේදී අවශ්‍ය ටෙම්ප්ලේට් සහ ගේජස් යොදා සැකසීම.<br>**d)** ඔයිල් සෑන්ඩ් මිශ්‍රණය සෑදීම සහ එමගින් කෝර සෑදීමට හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |
| **පිරිසැකසුම්කරු (ලෝහ) (Fabricator (Metal))** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** ලෝහ කැපීම සඳහා සලකුණු කිරීම කළ හැකි විය යුතු යි.<br>**b)** පිරි සකසන ලද ලෝහ කොටස් එකලස් කළ හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |
| **උඳුන්කරු (Furnace man)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>**a)** දෙන ලද පිරිවිතරයකට අනුව ලෝහ ද්‍රව කිරීම සඳහා අවශ්‍ය නියමිත බරින් යුත් ලෝහ හා අමතර ද්‍රව්‍ය යෝදා කියුපෝලාව/උඳුන නිසි පරිදි ක්‍රියාත්මක කළ හැකි වීම.<br>**b)** ෆෙරස්/ නිෆෙරස් අංශවල යොදා ගන්නා පොදු ලෝහ වර්ග හඳුනා ගත හැකි විය යුතු වන අතර කියුපෝලාවට යොදා ගත යුතු නිවැරදි කෝක් ග්‍රේඩය හඳුනා ගත හැකි විය යුතු යි.<br>**c)** ෆර්නසය ක්‍රියා කරවීම ආරම්භ කර අවශ්‍ය ලෝහ කොටස් චාර්ජ් කර උණුකර අපද්‍රව්‍ය ඉවත් කර ද්‍රවණය වූ ලෝහය ලබා ගෙන ෆර්නසය තමා විසින්ම නවතා දැමීමට හැකි විය යුතු වන අතර උදව්කරුවන් යොදා ගෙන සාර්ථකව වාත්තුව ලබාගත හැකි විය යුතු යි.<br>**d)** කියුපෝලාවට සහ ෆර්නසයට සම්බන්ධවන බ්ලෝවර්, බර්නර්ස්, ඔසවනය සහ අමුද්‍රව්‍යය ද ඇතුළත් කරන උපකරණ, සහ බර කිරන සියලුම යන්ත්‍ර, ක්‍රියා කරවිය හැකි විය යුතු යි.<br>**e)** ෆෙරස් සහ නිෆෙරස් අංශ වල ඇති විවිධ ලෝහ (ඇලෝයිස්) කොටස් කැඩීමෙන් හෝ අනිකුත් ක්‍රම මගින් හඳුනා ගත හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| තනතුරු නාමය | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| වැද්දුම්කරු (සාමාන්‍ය) **(Fitter (General))** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** යන්ත්‍ර උපකරණ සහ ඩයි වර්ග කොටස් එකලස් කිරීම සහ සවි කිරීම.<br>**b)** යන්ත්‍රෝපකරණ නඩත්තුව පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතු යි. | පැය **01** | **100** | **40** |
| බර වාහන ක්‍රියාකරු **(Heavy Vehicle Operator )** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** මගී බස්රථයක් පැදවිය හැකි විය යුතු යි.<br>**b)** භාණ්ඩ රැගෙන යන ලොරියක් පැදවිය හැකි විය යුතු යි.<br>**c)** ෆොර්ක්ලිෆ්ට් යන්ත්‍රයක් ක්‍රියා කරවිය හැකි විය යුතු යි.<br>**d)** බර වාහනවල නඩත්තුව පිළිබඳ මූලික අවබෝධයක් ලබා තිබිය යුතු යි. | පැය **01** | **100** | **40** |
| නළ කර්මාන්තකරු **(Pipe Fitter)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** උණුසුම් සහ සීතල ජල සැපයුම් නල සවි කිරීම සහ නඩත්තුව.<br>**b)** මල අපද්‍රව්‍ය පද්ධති සවිකිරීම සහ නඩත්තුව<br>**c)** විල් වොටර් නල සවිකිරීම සහ නඩත්තුව<br>**d)** වාෂ්ප පයිප්ප පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>**e)** සම්පීඩන වායු නල පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>**f)** ගිනි නිවන උපකරණ සහ උපාංග සවි කිරීම සහ නඩත්තු කිරීම<br>**g)** ගෑස් සපයන නල පද්ධති සවි කිරීම සහ නඩත්තුව<br>**h)** පොම්ප සවි කිරීම් සහ නඩත්තුව | පැය **01** | **100** | **40** |
| යන්ත්‍ර ක්‍රියාකරු ( නිෂ්පාදන) **(Machine Operator (Production))** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** කම්මල් හැඩ තලන යන්ත්‍ර සහ පීඩක ක්‍රියාකරවීම සහ දෛනික නඩත්තු කළ හැකි විය යුතු යි.<br>**b)** බෝල්ට් ඇණ හැඩ තලන යන්ත්‍ර ක්‍රියාකරවීම සහ නඩත්තු කිරීම කළ හැකි විය යුතු යි.<br>**c)** ද්‍රව පීඩක යන්ත්‍ර ක්‍රියාකරවීම සහ දෛනික නඩත්තු කළ හැකි විය යුතු යි. | පැය **01** | **100** | **40** |
| යන්ත්‍රකරු **(Machinist )** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** ලේත් යන්ත්‍රණ කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතු යි.<br>**b)** ඩ්‍රිලින් සහ ඒ ආශ්‍රිත කටයුතු පිළිබඳ මනා පළපුරුද්දක් තිබිය යුතු යි.<br>**c)** ලේත් සහ ඩ්‍රිලින් ටූල්ස් ග්‍රයින්ඩින් කිරීම පිළිබඳ පළපුරුද්දක් ලබා තිබිය යුතු යි. | පැය **01** | **100** | **40** |

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| තනතුරු නාමය | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| **යන්ත්‍රකරු(ලී) (Machinist) (Wood))** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් දැව ඉරන යන්ත්‍ර 06න් අවම වශයෙන් මට්ටම සහ ඝණකම ගෑමේ යන්ත්‍ර ඇතුළත්ව යන්ත්‍ර 05 ක් ක්‍රියාකරවීමට සමත් විය යුතු යි:<br>**a)** මෝටයිසින් යන්ත්‍රය (Mortising Machine)<br>**b)** ටොනොනින් යන්ත්‍රය (Tennoning Machine)<br>**c)** සරල මෝල්ඩින් යන්ත්‍රය<br>**d)** සැන්ඩින් යන්ත්‍රය<br>**e)** දැව ලියවීමේ යන්ත්‍රය<br>**f)** මට්ටම සහ ඝණකම ගෑමේ යන්ත්‍රය | **පැය 01** | **100** | **40** |
| වාත්තුකරු **(Foundry Man)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** අමු පස් හෝ වියළි අරු පස් යොදාගෙන සංකීර්ණ කොටස් තුනක හෝ දෙකක මධ්‍යම ප්‍රමාණයේ වාත්තු අච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් වාත්තුවක් සඳහා පිළියෙල කළ යුතු යි. සාදන ලද අච්චුව වාත්තු පරීක්ෂණයකට සතුටුදායක ලෙස භාජනය කළ හැකි විය යුතු යි.<br>**b)** කොටස් දෙකක හෝ තුනක වාත්තු අච්චුවක් සෑදීම සඳහා වියළි අරුපස් හෝ අමු පස් සකසා ගෙන සංකීර්ණ හෝ මධ්‍යම ප්‍රමාණයේ වාත්තු අච්චුවක් ෆෙරස් හෝ නිෆෙරස් ලෝහවලින් සෑදීම. මෙම වාත්තු අච්චුව සතුටුදායක ලෙස වාත්තු පරීක්ෂණයකට භාජනය කළ හැකි විය යුතු යි. | **පැය 01** | **100** | **40** |
| වාත්තුමල්කරු **(Pattern Maker)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** කෝර ප්‍රින්ට් භාවිතා කිරීමට අදාලව දෙන ලද සැලසුමකට අනුව වාත්තු මලක් සෑදීම.<br>**b)** දෙනු ලබන සැලසුමකට අනුව ඕනෑම වර්ගයක වාත්තු මලක් සෑදීම. | **පැය 01** | **100** | **40** |
| ජල නළ කාර්මික **(Plumber)** | **විෂයය දැනුම** | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂයය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි:<br>**a)** ගෘහස්ත ජලනළ පද්ධති අලුතින් සවි කිරීම සහ අලුත් වැඩියාව සහ ජල පොම්ප සවි කිරීම.<br>**b)** මලා පවහන පද්ධති සවි කිරීම<br>**c)** ගෘහස්ත කුණු ජලය සහ අපද්‍රව්‍ය බැහැර කරන පද්ධති සවි කිරීම සහ නඩත්තු කිරීම.<br>**d)** ඕනෑම වර්ගයේ පයිප්ප සහ උපාංග (වානේ පයිප්ප) සවි කිරීම. | **පැය 01** | **100** | **40** |

| තනතුරු නාමය | ප්‍රශ්න පත්‍රය | විෂයය නිර්දේශය | කාලය | මුළු ලකුණු | සමත් ලකුණු |
|---|---|---|---|---|---|
| පෑස්සුම්කරු (welder) | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර හතරකින් සමත් විය යුතු යි.<br>**NVQ හතරවන මට්ටම ආර්ක් පෑස්සුම**<br>**a)** ඔක්සි ඇසිටිලීන් ගෑස් මගින් වානේ කැපීම<br>**b)** ප්ලැට් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම (1G සහ 1F)<br>**c)** තිරස් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම<br>**d)** සිරස් පිහිටීමේ දී වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම(3G)<br>**e)** ඕවර්හෙඩ් ක්‍රමයට වානේ තහඩු මැනුවල් ආර්ක් ක්‍රමයට පෑස්සීම(4G)<br>**f)** සෝල්ඩරින් සහ බ්‍රෙසීන් කිරීම<br><br>**NVQ හතරවන මට්ටම ටිග් පෑස්සුම**<br><br>**a)** ඔක්සි ඇසිටිලීන් ගෑස් මගින් වානේ කැපීම<br>**b)** ප්ලැට් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම<br>**c)** තිරස් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම<br>**d)** සිරස් පිහිටීමේ දී වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (3G)<br>**e)** ඕවර්හෙඩ් ක්‍රමයට වානේ තහඩු ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (4G)<br>**f)** සියලුම පිහිටීමේදී වානේ පයිප්ප ඔක්සි ඇසිටිලීන් ගෑස් ක්‍රමයට පෑස්සීම (6G) | පැය 01 | **100** | **40** |
| දැව කර්මාන්තකරු (දැව භාණ්ඩ) (Carpenter (Furniture)) | විෂය දැනුම | ප්‍රායෝගික පරීක්ෂණය පහත සඳහන් විෂය ක්ෂේත්‍ර දෙකකින් සමත් විය යුතු යි.<br>**a)** දැව භාණ්ඩ සෑදීමට ඇස්තමේන්තු ලබා දිය හැකි විය යුතු යි<br>**b)** දැව බෝර්ඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතුයි.<br>**c)** දැව කුට්ටි සහ දැව බෝර්ඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතු යි<br>**d)** යන්ත්‍රණය කර නිමා කරන ලද දැව වලින් සහ දැව බෝර්ඩ් මගින් දැව භාණ්ඩ නිපදවිය හැකි විය යුතුයි<br>**e)** අදාළ සියළුම යන්ත්‍රෝපකරණ නඩත්තුව සහ ආයුධ උපකරණ මුවහත් කිරීම සහ පවර් ටූල් නඩත්තුව කල හැකි විය යුතු යි. | පැය 01 | **100** | **40** |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**10.1.2 යෝග්‍යතා ඇගයීම් සම්මුඛ පරීක්ෂණය**

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | ලකුණු ලබාදෙන ආකාරය | ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | අ.පො.ස (උසස් පෙළ) විභාගයේ සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර එක් සමත් විෂයකට ලකුණු 2 බැගින් | 06 |
| | | පිළිගත් ආයතනයකින් ලබාගත් ඩිප්ලෝමා හෝ සහතිකපත් පාඨමාලා<br>i. මාස 03ත් 06ත් අතර පාඨමාලා ලකුණු 04<br>ii. මාස 06ත් 12ත් අතර පාඨමාලා ලකුණු 08<br>iii. මාස 12 හෝ ඊට වැඩි පාඨමාලා ලකුණු 14 | 14 |
| සේවා පළපුරුද්ද | 40 | රජයේ හෝ පෞද්ගලික ආයතනයක අදාල ක්ෂේත්‍රයේ පළපුරුද්ද සඳහා එක් වසරකට ලකුණු 08 ක් බැගින් | 40 |
| පුහුණු පාඨමාලා හදාරා තිබීම | 15 | රජය විසින් පිලිගත් ආයතනයකින් හදාරා ඇති ඉංජිනේරු ක්ෂේත්‍රයේ පුහුණු පාඨමාලා සඳහා<br>i. මසකට අඩු ලකුණු 02 බැගින්<br>ii. මාස 01ත් 03ත් අතර ලකුණු 05 බැගින්<br>iii. මාස 03ත් 06ත් අතර ලකුණු 10<br>iv. මාස 06ට වැඩි ලකුණු 15 | 15 |
| විෂය බාහිර ක්‍රියාකාරකම් | 20 | ක්‍රීඩා සහතික සඳහා පළාත් මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 5 ක් ද, සමස්ථ ලංකා මට්ටමේ ජයග්‍රහණ සඳහා ලකුණු 10ක් ද (1 ක් හෝ වැඩි ප්‍රමාණයක් සඳහා) පාසලේ ශිෂ්‍ය නායක තනතුරු සඳහා ලකුණු 05 ක් හිමි වේ. | 20 |
| සම්මුඛ පරීක්ෂණයේ දී පෙන්වන කුසලතාවය | 05 | සම්මුඛ පරීක්ෂණයේ දක්වන කුසලතාවය අනුව ලකුණු ලබා දේ. | 05 |
| එකතුව | | | **100** |

***සටහන*** - තනතුරට අදාළව ලබා ඇති පළපුරුද්ද පිළිගත හැකි සහතික මගින් සනාථ කළ යුතු ය. එම සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසාන දින වන **2026.10.23** දිනට වලංගු විය යුතු ය.

**11.0** රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතුය.

**12.0** ඉල්ලුම් පත්‍රය පිරවීමේදී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතු ය. සුදුසුකම් පරීක්ෂා කිරීමේදී යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් ඕනෑම අවස්ථාවක ඔහුගේ / ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය.( අයදුම්කරුවකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු /ඇය රජයේ සේවයෙන් පහ කළ හැක.)

**13.0** අයදුම්පත්‍රය නියමිත ආදර්ශ ආකෘතියට අනුකූලව ඉදිරිපත් කළ යුතු ය. නිවේදනයේ ඇතුලත් ආදර්ශ අයදුම්පතට අනුකූල නොවන හා අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**14.0** අයදුම්පතේ අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරියකු පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරන නිළධාරියකු හෝ රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතු ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**15.0** මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත දිනට හෝ එදිනට පෙර හෝ ඉල්ලුම් පත්‍ර ඉදිරිපත් කර ඇති සියලු අයදුම්කරුවන් රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් වෘත්තිය ප්‍රායෝගික පරීක්ෂණයට හා යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. එහෙත් එසේ කැඳවීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ දී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් එම අයගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

**16.0** අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් ඉදිරිපත් කළ යුතු ය.

I. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කර ඇති ජාතික හැඳුනුම්පත;
II. වලංගු ශ්‍රී ලාංකීක රියදුරු බලපත්‍රය;
III. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

**17.0** මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත්, ඒ සම්බන්ධව අවසන් තීරණය රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම නිවේදනයේ සඳහන් පොදු නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටි.

**18.0** ඉල්ලුම් කළ යුතු පිළිවෙල :-

සියලු විස්තර ඇතුළත් කරමින් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව සම්පූර්ණ කරන ලද අයදුම් පත්‍රය අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද, පුහුණු පාඨමාලා, විෂය බාහිර ක්‍රියාකරකම් සනාථ කරන සහතික වල පිටපත් ද, සමඟ **2026 ඔක්තෝබර් මස 23** දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "**අධ්‍යක්ෂ ජනරාල්, රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව, කොළොන්නාව පාර, කොළොන්නාව.**" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. ඉල්ලුම්පත් බහා එවන කවරයේ වම් පස ඉහළ කෙලවරේ "**ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ III වන ශ්‍රේණියේ තනතුරු සඳහා විවෘත බඳවා ගැනීම - (2026)** " යනුවෙන් පැහැදිලිව සඳහන් කළ යුතු ය.

**ඉංජි.එස්.එන්.බී.එම්.පද්මසිරි,**
අධ්‍යක්ෂ ජනරාල්.

2026 සැප්තැම්බර් මස 21 වන දින
රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුව,
කොළොන්නාව පාර,
කොළොන්නාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

[    ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

**රජයේ කර්මාන්තශාලා දෙපාර්තමේන්තුවේ**
**ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ තනතුරු සඳහා බඳවා ගැනීම - 2026**

**Recruitment to the posts in the Primary Skilled Service Category of the Department of Government Factory – 2026**

අයදුම්කරන භාෂා මාධ්‍යය:
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

තනතුරට අදාළ අනු අංකය [    ]

අයදුම්කරන තනතුර :- ………………………………………………………………………………………….
(එක් තනතුරකට එක් අයදුම්පත බැගින් ඉදිරිපත් කළ යුතු ය.)

**1.** (අ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් ) : ........................................................................................................
........................................................................................................................................................
(උදා: HERATH MUDIYANSELAGE SAMAN RATHNAYAKA)

(ආ) මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.......................................................................................................................................................
(උදා : H. M. S. RATHNAYAKA)

(ඇ) සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) : .......................................................................................
.......................................................................................................................................................

**2.** (අ) ස්ථිර ලිපිනය (සිංහලෙන්/ දෙමළෙන්) :
.......................................................................................................................................................
.......................................................................................................................................................

(ආ) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්):
.......................................................................................................................................................
.......................................................................................................................................................

(ඇ) ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය (සිංහලෙන් / දෙමළෙන්): ..........................................................
.......................................................................................................................................................

3. ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

**4.** ස්ත්‍රී / පුරුෂ භාවය : ස්ත්‍රී - 0
( අදාල අංකය කොටුව තුළ ලියන්න) පුරුෂ - 1 | |

**5.** උපන් දිනය : වර්ෂය : | | | | | මාසය: | | | දිනය: | | |

**6.** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස : අවුරුදු : | | | | | මාස : | | | දින : | | |

**7.** දුරකථන අංකය : | | | | | | | | | | |

**8.** අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතික පත්වල පිටපත් මේ සමග ඇමිණිය යුතු ය)

8.1 අ.පො.ස (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තර
I. පළමුවර ප්‍රතිඵල
විභාග අංකය : ................................................
: වර්ෂය ....................... මාසය .........................

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

II. දෙවන වර ප්‍රතිඵල
විභාග අංකය : ................................................
වර්ෂය ....................... මාසය ........................

| විෂයය | | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|---|
| 1. | | | 6. | |
| 2. | | | 7. | |
| 3. | | | 8. | |
| 4. | | | 9. | |
| 5. | | | 10. | |

8.2 අ.පො.ස (උ.පෙළ) විභාගය පිළිබඳ විස්තර
I. විභාගයේ වර්ෂය හා මාසය : ................................................
II. විභාග අංකය : ................................................
ප්‍රතිඵල

| විෂයය | | සාමාර්ථය |
|---|---|---|
| 1. | | |
| 2. | | |
| 3. | | |
| 4. | | |

**9.** අතිරේක අධ්‍යාපන සුදුසුකම් : (අදාළ සහතික පත්වල පිටපත් මේ සමග ඇමිණිය යුතු ය.)

| අනු. අංකය | ආයතනය | පාඨමාලාවේ නම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**10.** වෘත්තීය සුදුසුකම් : (අදාළ සහතික පත්වල පිටපත් මේ සමග ඇමිණිය යුතු ය.)

| අනු. අංකය | ආයතනය | පාඨමාලාවේ නම | NVQ මට්ටම | කාල සීමාව | සහතිකය වලංගු දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**11.** තනතුරට අදාළව ලබා ඇති සේවා පළපුරුද්ද :

| අනු. අංකය | සේවා කාලය | | තනතුර | සේවා ස්ථානය |
|---|---|---|---|---|
| | සිට | දක්වා | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

**12.** විෂයය බාහිර ක්‍රියාකාරකම් : ..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................
..........................................................................................................

**13.** දැනට කිසියම් රජයේ ආයතනයක තනතුරක් දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර :

I. තනතුර හා ශ්‍රේණිය : ..........................................................................
II. පත් වූ දිනය : ..........................................................................
III. ආයතනය : ..........................................................................
IV. විශ්‍රාම වැටුප් සහිත ස්ථිර තනතුරක් ද යන වග : ..........................................................................

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

**14.** ඔබ කවරදාක හෝ කවර හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද ?
(අදාළ කොටුවෙහි ✓ ලකුණ යොදන්න ) 'ඔව්' නම් විස්තරය සඳහන් කරන්න.

ඔව් ☐ නැත ☐

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

**15.** අයදුම්කරුගේ ප්‍රකාශය :

(අ) මෙම ඉල්ලුම් පත්‍රයේ මා විසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමෙන් සහ/හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳදරා ගැනීමට එකඟ වෙමි. තව ද මෙහි සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවද ප්‍රකාශ කරමි.

(ආ) මා විසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

(ඇ) මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

(ඈ) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් සනාථ කරන සහතික පත් වල පිටපත් අමුණා ඉදිරිපත් කරමි.

දිනය : ...................................

..............................,
අයදුම්කරුගේ අත්සන.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

**16.** **අයදුම්කරුගේ අත්සන සහතික කිරීම ( අදාළ නොවන වචන කපා හරින්න) :**

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ............................................................................................ නැමැති මහතා/ මහත්මිය/ මෙනෙවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ................................දින ඔහු/ ඇය මා ඉදිරිපිට අත්සන් කළ බවත් සහතික කරමි .

දිනය : ......................................

.....................................................,
සහතික කරන්නාගේ අත්සන.

සහතික කරන්නාගේ නම :..........................................................................................................
තනතුර :..........................................................................................................
ලිපිනය :..........................................................................................................
නිල මුද්‍රාව : ..........................................................................................................

**සටහන -** අයදුම්පත සහතික කළ යුත්තේ *ගැසට්* නිවේදනයේ 14 ඡේදයේ සඳහන් පරිදි විය යුතු ය.

**17.** රාජ්‍ය සේවයේ/ පළාත් රාජ්‍ය සේවයේ සේවකයකු නම්, ආයතන ප්‍රධානියාගේ සහතිකය :

මෙම අයදුම්පත ඉදිරිපත් කරන ..........................................................................................නැමැති මහතා/ මහත්මිය/ මෙනවිය මෙම අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තු/ සංස්ථාවේ/ මණ්ඩලයේ .................................... තනතුරේ සේවයේ නියුතු වන අතර, ඔහු /ඇය ඉහත තනතුර සඳහා තෝරා ගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් දන්වමි.

...................................................,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

ආයතන ප්‍රධානියාගේ නම :………………………………………………………………………………..
තනතුර :………………………………………………………………………………...
සේවා ස්ථානයේ ලිපිනය :……………………………………………………………………………..
නිල මුද්‍රාව : ..........................................................................................................

09 - 339

---

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර සහ සිංහල විශ්වකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

**01.** සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ පුරප්පාඩු පවතින පහත සඳහන් තනතුරු සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ :-

- සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර;
- සිංහල විශ්වකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර.

**02.** සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2026.10.16 දින හෝ ඊට පෙර ලැබෙන සේ සංස්කෘතික කටයුතු අධ්‍යක්ෂ, සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 8 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

03. මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත් ආකෘතිය අනුව A4(8.27 11.69) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කර අයදුම්පත් එවිය යුතු ය.

04. මෙම තනතුර සඳහා අයදුම්පත්‍ර එවීමේ දී අයදුම් කරනු ලබන තනතුර අයදුම්පත්‍ර බහා එවන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සඳහන් කර එවිය යුතු ය.

05. අයදුම්පත්‍ර පිරවීමේ දී අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් පිළිබඳ විස්තර නිවැරදිව ඇතුළත් කළ යුතු ය.

06. සේවයේ නියුක්ත කරවීම හා සේවා කොන්දේසි :

- වැටුප : රු. 150,000/- ක මාසික දීමනාවක් ගෙවනු ලැබේ. (ප්‍රවාහන හා ඉන්ධන දීමනාව රු. 50,000.00ක් ඇතුළත් වේ.)

- මෙම තනතුර කොන්ත්‍රාත් පදනම මත ඇති කළ තනතුරක් වන අතර, ස්ථිර පත්වීමක් ලබා ගැනීමට හෝ ස්ථිර නිලධාරින්ට හිමි වරප්‍රසාද සඳහා හෝ හිමිකම් නොමැති තනතුරකි. මෙම තනතුර සඳහා බඳවා ගනු ලබන්නේ එක් වර්ෂයක කොන්ත්‍රාත් කාලයක් සඳහා පමණි.

07. සුදුසුකම් :

7.1 අධ්‍යාපන සුදුසුකම් :-

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ආචාර්ය උපාධියක් ලබා තිබීම.

7.2 වෘත්තීය සුදුසුකම් : අදාළ නොවේ.

7.3 පළපුරුද්ද :-

01. (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මහාචාර්ය හෝ සහාය මහාචාර්ය තනතුරක අවම වශයෙන් අවුරුදු 10ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම;

*හෝ*

(ii) කෝෂ ග්‍රන්ථ කාර්යාලයක කර්තෘ තනතුරේ අවම වශයෙන් වසර 05ක අඛණ්ඩ හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

02. ඉංග්‍රීසි භාෂාව හා පාලි, සංස්කෘතික භාෂා පිළිබඳව ප්‍රවීණ දැනුමක් ලබා තිබීම. (ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී වාචිකව අදහස් ප්‍රකාශ කිරීමේ හැකියාව සහ ලිඛිත දැනුම පරීක්ෂා කර බලනු ලැබේ.)

7.4 කායික සුදුසුකම් :-

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

7.5 වෙනත් සුදුසුකම් :-

1. සියලුම අයදුම්කරුවන් ශ්‍රී ලංකා පුරවැසියන් විය යුතු ය.
2. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
3. තනතුරට බඳවා ගැනීම සඳහා 7.1 හි සිට 08 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළයුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ / *ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

08. වයස : අවුරුදු 60ට වැඩි සහ 72ට නොවැඩි විය යුතු ය.

09. බඳවා ගැනීමේ ක්‍රමය : ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ම සුදුසුකම් ද පරීක්ෂා කර බලනු ලැබේ.

ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :

| *ලකුණු ලබාදෙන ප්‍රධාන ක්ෂේත්‍ර* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 10 | අදාළ නොවේ. |
| පළපුරුද්ද | 30 | |
| කෝෂ ග්‍රන්ථ කාර්යාලයක සේවා කාලය | 10 | |
| අතිරේක භාෂා දැනුම | 15 | |
| මුද්‍රණ ශිල්පය පිළිබඳ දැනුම | 15 | |
| කර්තෘත්වයෙන් ප්‍රකාශිත ශාස්ත්‍රීය ග්‍රන්ථ | 15 | |
| සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන ලද කුසලතාවය | 05 | |
| එකතුව | 100 | |

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අණ පරිදි,

ලේකම්,
බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## ආදර්ශ අයදුම්පත්‍රය

### සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ සිංහල ශබ්දකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර සඳහා සහ සිංහල විශ්වකෝෂ කාර්යාලයේ ප්‍රධාන කර්තෘ තනතුර සඳහා (කොන්ත්‍රාත් පදනම මත) බඳවා ගැනීම

**1.0** (අ) මුලකුරු සමග නම : ……………………………………………………………………

(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම : ……………………………………………………………………

02. ලිපිනය : ……………………………………………………………………

03. දුරකථන අංකය : ……………………………………………………………………

04. ජාතික හැඳුනුම්පත් අංකය : ……………………………………………………………………

05. උපන් දිනය : ……………………………………………………………………

06. වර්තමානයේ යම් තනතුරක් දරන්නේ නම්,

I. දැනට දරන තනතුර : ……………………………………………………………………

II. සේවා ස්ථානය : ……………………………………………………………………

III. සේවා කාලය : ……………………………………………………………………

07. අධ්‍යාපන සුදුසුකම් :

I. ආචාර්ය උපාධිය ලබාගත් අධ්‍යයන ක්ෂේත්‍රය : ……………………………………………………………………

II. විශ්වවිද්‍යාලය : ……………………………………………………………………

III. උපාධි සහතිකයේ වලංගු දිනය : ……………………………………………………………………

IV. ආචාර්ය උපාධිය ලබා ඇති භාෂා මාධ්‍යය : ……………………………………………………………………

08. සේවා පළපුරුද්ද :

| | *තනතුර* | *විශ්වවිද්‍යාලය* | *සේවා කාලය* |
|---|---|---|---|
| I. | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | ………………………………………………… | …………………… |
| II. | මහාචාර්ය | ………………………………………………… | …………………… |
| III. | සහාය මහාචාර්ය | ………………………………………………… | …………………… |

09. ආචාර්ය උපාධිය ලබා ඇති අධ්‍යයන ක්ෂේත්‍රයට අදාළව පළකර ඇති ප්‍රකාශන පිළිබඳ විස්තර :

I. පළකර ඇති පර්යේෂණ නිබන්ධන :
II. පළකර ඇති කෘතීන් :
III. පළකර ඇති පර්යේෂණ පත්‍රිකා :
(මෙම ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම් ඇමුණුමකින් ඉදිරිපත් කරන්න.)

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

10. ඉහත අංක 09හි සඳහන් අධ්‍යයන ක්ෂේත්‍රයට පරිබාහිරව පළකර ඇති ප්‍රකාශන පිළිබඳ විස්තර :-
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
(මෙම ඉඩ ප්‍රමාණවත් නොවන්නේ නම් ඇමුණුමකින් ඉදිරිපත් කරන්න.)

11. ඉංග්‍රීසි භාෂාව හා පාලි, සංස්කෘත භාෂා පිළිබඳ ඇති දැනුම :
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................
(සනාථ කළහැකි සහතික හෝ ලිපි ලේඛන ඇමිණිය යුතු ය.)

.................................... (අයදුම්කරුගේ නම) වන මවිසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බව මෙයින් සහතික කරමි. මවිසින් සපයා ඇති ඉහත තොරතුරු සාවද්‍ය යැයි සොයා ගනු ලැබුව හොත් මට විරුද්ධව ක්‍රියා කිරීමට හැකි බව දනිමි.

දිනය : ............................ ..............................................,
අයදුම්කරුගේ අත්සන.

09 - 341

---

### අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ රියදුරු තනතුරේ III ශ්‍රේණියට විවෘත පදනම මත බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම - 2026

2023 අංක 9 දරන දූෂණ විරෝධී පනතේ 26(1) වගන්තියේ ප්‍රතිපාදන ප්‍රකාරව, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ ප්‍රාථමික සේවා මට්ටම (ශිල්පීය) රියදුරු III ශ්‍රේණියෙහි තනතුරු පුරප්පාඩු 46ක් සඳහා විවෘත පදනමින් බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකීක පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**1. බඳවා ගැනීමට අවශ්‍ය සුදුසුකම් :-**

1.1. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් සිංහල/ දෙමළ භාෂාව ඇතුලුව සම්මාන දෙකක් සහිතව විෂයයන් හයක් සමත් වීම.

1.2. වෘත්තීය සුදුසුකම් : බර වාහන පැදවීම පිළිබඳ මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

1.3. පළපුරුද්ද : වාහන රියදුරකු වශයෙන් වසර තුනක පළපුරුද්දක් (ඛණ්ඩ/අඛණ්ඩ) තිබිය යුතු ය. (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතු ය.)

1.4. කායික සුදුසුකම් : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය. දිවා හා රාත්‍රී කාලයේදී මනා ඇස් පෙනීමකින් යුක්ත විය යුතු අතර එය වෛද්‍ය සහතිකයකින් සනාථ කළ යුතු ය. උස අඩි 5ක් තිබිය යුතු ය.

ට 1.5. වෙනත් සුදුසුකම් : i. ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**2.** වයස :- **- අවම සීමාව 25**
**- උපරිම සීමාව 45**

**3.** වැටුප් පරිමාණය :- **රු.43,280-10x490-10x540-10x590-12x630 - රු.67,040**
ඒ අනුව මෙම තනතුරට හිමි වැටුප් කේතය AC-PL-3-2025 වන අතර ආරම්භක වැටුප් පියවර රු.43,280/- වේ. මීට අමතරව පාර්ලිමේන්තුව විසින් 2026.03.17 තනතුරට අදාළ වන පරිදි අනුමත කර ඇති අනෙකුත් දීමනා ද ගෙවනු ලැබේ. (2027.01.01 දිනට පෙර බඳවා ගත හොත් වැටුප් ගෙවනු ලබන්නේ වැටුප් පරිමාණයට අදාළ උපලේඛන II අනුව වේ. එනම් ගෙවන වැටුප රු. 40,834.00 වේ)

4. බඳවා ගැනීමේ ක්‍රමය :- **100% විවෘත පදනමින් බඳවා ගැනේ.**

**4.1 වෘත්තීය පරීක්ෂණයකින් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් සමන්විත වේ.**

**4.1.1 වෘත්තීය පරීක්ෂණය -**

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන විෂය* | *උපරිම ලකුණු* | *තෝරා ගැනීමට සළකා බලනු ලබන අවම ලකුණු* |
|---|---|---|
| රිය පැදවීමේ නිපුනතාවය | 40 | 20 |
| මහා මාර්ග නීති පිළිබඳ ප්‍රායෝගික දැනුම | 40 | 20 |
| මෝටර් යාන්ත්‍රික විද්‍යාව පිළිබඳ මූලික දැනුම | 20 | 10 |

- වෘත්තීය පරීක්ෂණ මණ්ඩලය පහත නිලධාරින්ගෙන් සමන්විත වේ.

i. කොමිෂන් සභාවේ විධායක නිලධාරියෙකු සභාපති ලෙස,
ii. මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් දෙපාර්තමේන්තුවේ මෝටර් රථ වාහන පරීක්ෂකවරයෙකු,
iii. පොලිස් රථ වාහන අංශයේ නිලධාරියෙකු.

4.1.2. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය -

| *ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *තෝරාගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| අතිරේක අධ්‍යාපන සුදුසුකම් | 20 | 60 |
| අතිරේක සේවා පළපුරුද්ද | 15 | |
| වෙනත් භාෂා ප්‍රවීණතාවය | 10 | |
| විෂයානුබද්ධ දැනුම | 25 | |
| සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 30 | |
| **මුළු ලකුණු** | **100** | |

- ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩල සාමාජිකයින් තිදෙනෙකුගෙන් සමන්විතය.

Gazette.lk

*සටහන* i. වෘත්තීය පරීක්ෂණයේ ලකුණු 50 ට වඩා ලබා ගෙන සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. වෘත්තීය පරීක්ෂණයේ හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ කුසලතා අනුපිළිවෙල අනුව ඉහළම කුසලතාවය දක්වන අයදුම්කරු/ අයදුම්කරුවන් පුරප්පාඩු ගණන අනුව රියදුරු III ශ්‍රේණිය තනතුරට බඳවා ගනු ලැබේ.

ii. බඳවා ගැනීම සිදු කරන අවස්ථාවේ දී ඉහත වගුවේ දැක්වෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුළත, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටිය අනුමත කිරීම කොමිෂන් සභාව විසින් සිදු කරනු ලැබේ.

**5. සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි :-**

**i. මෙම පත්වීම අංක 2504/7 හා 2026.09.01 දිනැති *ගැසට්* නිවේදනය මඟින් කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද බඳවා ගැනීමේ පරිපාටියේ විධිවිධානවලට යටත් වේ.**

**ii. මෙම තනතුර ස්ථිර ය. සේවක අර්ථ සාධක අරමුදල සහ සේවක භාර අරමුදල් ප්‍රතිලාභ හිමි ය.**

iii. මෙම පත්වීම අවුරුදු 3 ක පරිවාස කාලයකට යටත් වේ.

iv. තනතුරට බඳවා ගෙන වසර 3 ක් ඇතුළත බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් ආකාරයට කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතු ය.

v. පරිවාස කාලය අවසානයේ වැඩ, පැමිණීම, හැසිරීම සතුටුදායක වීම හා කාර්යක්ෂමතා කඩඉම සමත්වීම සළකා බලා සේවය ස්ථිර කිරීම සිදු කරනු ලැබේ.

vi. කොමිෂන් සභාව විසින් හඳුන්වා දෙනු ලබන කාර්ය සාධන ඇගයීම් දර්ශක අනුව වාර්ෂිකව ඔබගේ කාර්ය සාධනය ඇගයීමට ලක් කෙරේ. ඒ අනුව ඉදිරි වැටුප් වර්ධක ලබා දීම සිදුකරන අතර උසස් වීම් සඳහා ද එම කාර්ය සාධනය උපයෝගී කරනු ලැබේ.

vii. රාජ්‍ය භාෂාවක් නොවන මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් පරිවාස කාලය තුළ නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

viii. 2023 අංක 09 දරන දූෂණ විරෝධී පනත, අංක 2504/7 හා 2026.09.01 දිනැති *ගැසට්* නිවේදයෙහි ඇතුළත් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා රීති, ආයතන සංග්‍රහය II, මුදල් රෙගුලාසි හා වරින්වර අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව විසින් පනවනු ලබන රීතිවලට සහ චක්‍රලේඛවලට මෙම පත්වීම යටත් ය.

ix. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩ දෙනු නොලබන අතර ඔබ පත්වීම ලැබීමට සුදුසුකම් ලත් භාෂා මාධ්‍යය වනුයේ ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**6. අපේක්ෂකයන්ගේ අනන්‍යතාවය :-**

**i. වෘත්තීය පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයෙන්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි.**

**ii. වෘත්තීය /ව්‍යුහගත පරීක්ෂණයේ දී තමන්ගේ අනන්‍යතාව සහතික කිරීම සඳහා පහත අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.**

**(a) පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත;**

**(b) වලංගු විදේශ ගමන් බලපත්‍රය;**

**(c) වලංගු රියදුරු බලපත්‍රය,**

**7. අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ආකාරය :**

**i. අයදුම්පත්, අධ්‍යක්ෂ ජනරාල්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව, තැ.පෙ.1431, 36, මලලසේකර මාවත, කොළඹ 07 යන ලිපිනය සඳහන් කර 2026 ඔක්තෝබර් මස 16 දින හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**ii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘතියක් මෙම නිවේදනය අවසානයේ දක්වා ඇත. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කර ඉදිරිපත් කළ යුතු ය.**

**iii. අයදුම්පත් බහා එවන ලිපි කවරය ඉහළ වම් කෙළවරේ "රියදුරු තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීම" යනුවෙන් පැහැදිළිව සඳහන් කළ යුතු ය.**

**iv. අයදුම්පත්‍රයෙහි අයදුම්කරුගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු/ සාමදාන විනිශ්වයකාරවරයෙකු/ දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු/ ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු හෝ රු.71,240/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන, නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.**

**v. අයදුම්පත් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට හෝ කෙරෙන පැමිණිලි ගැන සළකා බලනු**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

නොලැබේ. අවසාන දිනය දක්වා තම අයදුම්පත් පමා කරන අයදුම්කරුවන් ඉන් සිදු විය හැකි ප්‍රතිවිපාක තමන් විසින්ම විඳ දරා ගත යුතු ය.

vi. අයදුම්පත්‍රය සමඟ පහත ලේඛනවල සහතික කරන ලද එක් ඡායා පිටපතක් බැගින් අමුණා එවිය යුතු අතර වෙනත් කිසිදු ලේඛනයක් නොඇමිණිය යුතු ය:

(a) ජාතික හැඳුනුම්පතෙහි සහතික කරන ලද පිටපත.
(b) උප්පැන්න සහතිකයේ සහතික කරන ලද පිටපත.
(c) ඉහත ඉල්ලුම්කර ඇති අධ්‍යාපන සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත්.
(d) ඉහත ඉල්ලුම්කර ඇති වෘත්තීය සුදුසුකම්වලට අදාළ සහතිකවල සහතික කරන ලද පිටපත්.
(e) ඉහත ඉල්ලුම්කර ඇති පළපුරුද්ද සනාථ කෙරෙන සහතිකවල සහතික කළ පිටපත්
(f) අයදුම්පත් යොමු කිරීමේ අවසාන දිනට මසක් ඇතුළත ලබා ගත් වෛද්‍ය සහතිකවල (ඉල්ලුම් කරන ලද) සහතික කරන ලද පිටපත්.
(g) චරිතය පිළිබඳව සඳහන් වන මෑතක දී ලබා ගත් චරිත සහතික **2** ක සහතික කළ පිටපත්.

*සටහන :* සම්මුඛ පරීක්ෂණය අවස්ථාවේ දී අදාළ ලේඛනවල මුල් පිටපත්, අයදුම්පත්‍රයට අමුණා ඇති සහතික කරන ලද පිටපත් සනාථ කර ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**8.** සාවද්‍ය තොරතුරු සැපයීම.

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බවට බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එවැනි අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

**9.** පුරප්පාඩු පිරවීම / නොපිරවීම පිළිබඳ අවසාන තීරණය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු වේ.

**10.** බඳවා ගැනීම් සම්බන්ධයෙන් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ තීරණය අවසන් තීරණය වේ.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇතිවුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ නියමය පරිදි,

ආර්.එස්.ඒ.දිසානායක,
අධ්‍යක්ෂ ජනරාල්.

**2026** සැප්තැම්බර් මස **21** වැනි දින,
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව,
තැ.පෙ. **1431**,
**36**, මලලසේකර මාවත,
කොළඹ **07**.

| |
|---|
| |

(කාර්යාල ප්‍රයෝජනය සඳහා පමණයි)

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

*විවෘත පදනම මත රියදුරු තනතුරේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ අයදුම්පත*

මාධ්‍ය

| | |
|---|---|
| සිංහල | |
| දෙමළ | |
| ඉංග්‍රීසි | |

**(අයදුම්පත ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් පිරවිය යුතු ය)**

| | | |
|---|---|---|
| 1.0 | 1.1. සම්පූර්ණ නම | |
| | 1.2. සම්පූර්ණ නම (සිංහල / දෙමළ) | |

| | | |
|---|---|---|
| | 1.3. මුලකුරු සමඟ නම | |
| 2.0 | 2.1. ස්ථිර ලිපිනය | |
| | 2.2. දිස්ත්‍රික්කය | |
| | 2.3. පළාත | |
| 3.0 | 3.1. ස්ත්‍රී/ පුරුෂ භාවය | |
| | 3.2. ජාතික හැඳුනුම්පත් අංකය | |
| 4.0 | 4.1. ජංගම දුරකතන අංකය/whatsapp අංකය | |
| | 4.2. ස්ථාවර දුරකතන අංකය | |
| | 4.3. විද්‍යුත් තැපැල | |
| 5.0 | 5.1. උපන් දිනය | |
| | 5.2. අයදුම්පත් භාරගැනීමේ අවසන් දිනට වයස | අවු: මාස: දින: |
| 6.0 | 6.1. විවාහක / අවිවාහක බව | |
| 7.0 | 7.1. උස | |
| 8.0 | 8.1. ජාතිය | |
| 9.0 | 9.1. ආගම | |

**10.0 අධ්‍යාපන සුදුසුකම්: භාෂා මාධ්‍ය: ...........................................................**

| අ.පො.ස. (සාමාන්‍ය පෙළ) වර්ෂය : .............................. විභාග අංකය : .......................................... | | | |
|---|---|---|---|
| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
| | | | |
| | | | |
| | | | |
| | | | |
| | | | |

**11.0 වෘත්තීය සුදුසුකම් :-**

..............................................................................................................................

..............................................................................................................................

**12.0 පළපුරුද්ද:-**

| *ආයතනය* | *කාලය (අවුරුදු ගණන)* |
|---|---|
| | |
| | |
| | |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**13.0 අතිරේක අධ්‍යාපන සුදුසුකම් :**

| *උදා: අ.පො.ස. උසස් පෙළ විභාගය* | *පාසල / ආයතනය* | *ප්‍රතිඵල* |
|---|---|---|
| | | |
| | | |
| | | |

**14.0. භාෂා ප්‍රවීණතාවය :**

| *භාෂාව* | *සුදුසුකම තහවුරු කිරීම සඳහා ඉදිරිපත් කළ හැකි ලේඛන* |
|---|---|
| (අ). සිංහල භාෂාව | |
| (ආ). දෙමළ භාෂාව | |
| (ඇ). ඉංග්‍රීසි භාෂාව | |
| (ඇ). වෙනත් විදේශ භාෂා | |

**15.0 වෙනත් සුදුසුකම් :-**

…………………………………………………………………..……………………………………………………………

…………..…………………………………………..…………………………………………………………………………

**16.0 අයදුම්කරුගේ ප්‍රකාශය:**

මෙම අයදුම්පතෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙහි සඳහන් කිසියම් තොරතුරක් වැරදි හෝ සාවද්‍ය බව බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව හෝ හෙලි වුවහොත් මාගේ අපේක්ෂකත්වය/ හෝ පත්වීම අවලංගු කිරීමේ අයිතිය අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව සතු බව දනිමි.

මෙම බඳවා ගැනීම සම්බන්ධයෙන් පවතින නීති රීතිවලට බැඳී සිටීමට හා නීති රෙගුලාසි අනුව මා නුසුදුස්සෙකු බව පෙනී ගියහොත් බඳවා ගැනීමට පෙර හෝ ඉන් පසුව මාගේ අපේක්ෂකත්වය හෝ පත්වීම අවලංගු කිරීම සඳහා ගනු ලබන ඕනෑම තීරණයකට යටත් වන බවට මම එකඟ වෙමි.

...................................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය:…………………………………...

**17. අත්සන සහතික කිරීම**

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන .................................................................................... මහතා මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, .......................................... දින මා ඉදිරිපිට දී අත්සන් තැබූ බව මෙයින් සහතික කරමි.

....................................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන
සහ නිල මුද්‍රාව

අත්සන සහතික කරන නිලධාරියාගේ;

සම්පූර්ණ නම :-...........................................................................................

තනතුර :-...........................................................................................

ලිපිනය :-...........................................................................................

දින :-...........................................................................................

09 - 342

### රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරේ පවතින පුරප්පාඩු 02ක් විවෘත පදනම යටතේ පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2026/10/30 වේ.

1. තනතුරෙහි කාර්යයන්:

- ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා එහි විෂයය පථයට අයත් දිස්ත්‍රික් කාර්යාල, ගොවිජන සේවා මධ්‍යස්ථානවල නීතිමය කටයුතු සඳහා උපදෙස් ලබාදීම, පනත් කෙටුම්පත්, රෙගුලාසි, නිරීක්ෂණ වාර්තා, පෙරකලාසි වැනි නීතිමය ලියවිලි සකස් කිරීම.

- නීතිපති දෙපාර්තමේන්තුව හා සම්බන්ධීකරණය සහ මානව හිමිකම් පැමිණිලි සම්බන්ධව ක්‍රියා කිරීම සහ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ එහි විෂය පථයට අයත් ඉහත කී රාජ්‍ය ආයතනවල නිලධාරීන් රාජකාරි විෂය පථයට අදාළ කරුණක් මත වග උත්තරකරුවන් වන නඩු සම්බන්ධයෙන් උපදෙස් ලබාදීම සහ නඩු සඳහා සහභාගි වීම.

- ආයතන සංග්‍රහයේ XXXIII පරිච්ඡේදයේ 4-5-6-7 වගන්ති සහ ආයතන සංග්‍රහයේ XI පරිච්ඡේදයේ 1 වන වගන්තිය අනුව කටයුතු කිරීමට අවශ්‍ය උපදෙස් ලබාදීම, මහපෙන්වීම සිදුකිරීම සහ ඊට අදාළ අනෙකුත් කටයුතු සිදුකිරීම සහ ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් විසින් පවරනු ලබන වෙනත් රාජකාරි.

2. බඳවා ගැනීමේ ක්‍රමය:

නිවේදනයේ දක්වා ඇති සුදුසුකම් සම්පූර්ණ කර ඇති අයදුම්කරුවන් අතරින්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් පවත්වනු ලබන යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත ඉහළම ලකුණු ලබා ගන්නා අපේක්ෂකයින් පුරප්පාඩු සඳහා බඳවා ගනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද (අංක 7 යටතේ සඳහන්) ලකුණු ලබාදීමේ පටිපාටියට අනුකූලව යෝග්‍යතාව ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

පත්වීම ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

3. අවශ්‍ය සුදුසුකම්:

3.1. අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම්

ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම.

3.2. පළපුරුද්ද

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දීමෙන් පසු නීතිඥවරයෙකු වශයෙන් වසර තුන (03) කට නොඅඩු සක්‍රීය වෘත්තීය පළපුරුද්දක් ලබා තිබීම. (සක්‍රීය වෘත්තීය පළපුරුද්ද සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරනු ලබන ලේඛනවල පළපුරුද්ද ලබාගත් කාලය, සහතික කරන්නාගේ නිලමුද්‍රාව හා සහතික කළ දිනය පැහැදිලිව සඳහන් කර තිබිය යුතු ය.)

*හෝ*

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම්දීමෙන් පසු රාජ්‍ය ආයතනයක නීතිමය තනතුරක * වසර තුන (03) කට නොඅඩු පළපුරුද්ද ලබා තිබීම.

I. නඩු සම්බන්ධයෙන් නීති කටයුතු හා නීතිපති දෙපාර්තමේන්තුව සමග සම්බන්ධීකරණ කටයුතු කිරීම.
II. ගිවිසුම් හා සම්බන්ධ නීති කටයුතු.
III. අදාළ අණ පනත් සම්බන්ධ නෛතික කටයුතු.
IV. පනත් කෙටුම්පත්, චක්‍රලේඛ, රෙගුලාසි වැනි නීත්‍යානුකූල ලියවිලි සම්පාදන කටයුතු.
V. විවිධ ව්‍යවස්ථාපිත ආයතනවලින් පවත්වනු ලබන නීති හෝ අධිකරණ කටයුතු හෝ පරීක්ෂණ කටයුතු.

*සටහන* - මූලික සුදුසුකම සනාථ කෙරෙන ලේඛනවල අයදුම්කරු විසින්ම සහතික කළ පිටපත් අයදුම්පත්‍රයට අමුණා තිබිය යුතුය. **සේවා කාලය ආරම්භ වන හා අවසාන වන දිනය පැහැදිළිව සඳහන් සහතික අමුණා නොමැති අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.**

*නීතිමය තනතුරක් යනු නීති උපාධිය හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිවුරුම් දී තිබීම බඳවා ගැනීමේ මූලික සුදුසුකමක් වන තනතුරු ය.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

3.3. කායික යෝග්‍යතාව:

සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටුකිරීමටත්, ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

3.4. වෙනත් සුදුසුකම්:

i. අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

ii. රජයේ නිලධාරියෙකු වන අයදුම්කරුවන් රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.

iii. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට, එනම්, 2026/10/30 දිනට තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු යි.

4. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි:

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ. ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතු අතර රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

ii. මෙම පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් ය. තනතුරට බඳවාගෙන වසර 03ක් ඇතුලත බඳවා ගැනීම් පටිපාටියේ සඳහන් ආකාරයට පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

iii. 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 18/2020 හි සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවලට ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ශ්‍රේණියේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා වන බඳවා ගැනීම් පටිපාටිය හා ඊට සිදුකර ඇති හෝ ඉදිරියේ දී සිදුකරනු ලබන සංශෝධනයන්හි ඇතුළත් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

v. ඉල්ලුම්කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම් ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පත්‍රයේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

5. වැටුප් පරිමාණය :

මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 දරන 2025.03.25 දිනැති චක්‍රලේඛයේ විධිවිධාන අනුව රු.82,150-10×2,400-8×2,940-17×3,900-රු. 195,970/- (SL1-2025)ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

6. වයස් සීමාව :

අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු 21ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45ට නොවැඩි විය යුතු ය.

7. යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලබන අතර, එහිදී පහත සඳහන් ලකුණු පටිපාටිය පදනම් කරගනු ලැබේ.

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 01 | **අතිරේක අධ්‍යාපන සුදුසුකම්** | | **25** |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත් නීතිය පිළිබඳ පශ්චාත් උපාධියක් සඳහා | 25 | |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත්, නීතිය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ උසස් නීති අධ්‍යාපන ආයතනයෙන් ලබාගත් පශ්චාත් නීති ඩිප්ලෝමාවක් සඳහා | 20 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විදේශීය හෝ රාජ්‍ය විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා පාර්ලිමේන්තු පනතකින් ස්ථාපිත විශ්වවිද්‍යාලයකින් පිරිනමනු ලබන හෝ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25A වගන්තිය යටතේ පිළිගත්: | | |
| | ✓ පළමු පන්තියේ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 15 | |
| | ✓ දෙවන පන්තියේ ඉහළ සාමාර්ථය සහිත නීතිවේදී උපාධිය | 10 | |
| | ✓ පන්ති සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 07 | |
| | ✓ සාමාන්‍ය සාමාර්ථයක් සහිත නීතිවේදී උපාධිය | 05 | |
| | (ඈ) නීති විද්‍යාලයේ අවසාන වසරේ පළමු පන්තියේ සාමාර්ථය<br>නීති විද්‍යාලයේ අවසාන වසරේ දෙවන පන්තියේ සාමාර්ථය<br>*සටහන:* නීති විද්‍යාලයේ අවසන් විභාගය ගෞරව සාමාර්ථයක් සහිතව සමත් වී ඇත්නම් පමණක් ඉහත ලකුණු 05 ලබාදෙනු ලැබේ. | | |
| | (ඉ) රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන නීති ක්ෂේත්‍රයට අදාළ මාස 06කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | | |
| | (ඊ) රජයේ පිළිගත් ආයතනයක් විසින් ලබාදෙන නීති ක්ෂේත්‍රයට අදාළ මාස 03කට නොඅඩු ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා | | |
| | *(ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)* | | |
| 02 | **අතිරේක පළපුරුද්ද :**<br>නඩුවලට අදාළ ලේඛන සකස් කිරීම සහ විවෘත අධිකරණයේ කරුණු දැක්වීම් සඳහා | | **35** |

| | *නඩු ගොනු කිරීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)* | *අධිකරණ ඉදිරියේ පෙනී සිටි කරුණු දැක්වීම් සඳහා ලකුණු (එක් නඩුවක් සඳහා)* |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | 2 | 5 |
| අභියාචනාධිකරණය | 2 | 4 |
| මහාධිකරණය | 2 | 3 |
| දිස්ත්‍රික් උසාවි | 4 | 5 |
| විනිශ්චයාධිකාර | 2 | 3 |

***සටහන:* ඉහත සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාළ නඩු තීන්දුවල පිටපත් හෝ අවසන් වරට නඩුව පැවති දිනයේ නඩු වාර්තාවේ සහතික පිටපතක් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට ඉදිරිපත් කළ යුතු ය.**

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 03 | **භාෂා හැකියාව :** | | **15** |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ඇතුළත්ව ලබාගත් උපාධිය. | 15 | |
| | (ආ) පිළිගත් අන්තර්ජාතික හෝ ජාතික මට්ටමේ ආදර්ශ අධිකරණ තරගවලදී (Moot court Competition) දක්වා ඇති ඉංග්‍රීසි භාෂාවේ ව්‍යක්ත බව.<br><br><u>කේවල</u><br>i. ප්‍රථම ස්ථානය/ හොඳම කුසලතාව - 12<br>ii. දෙවන ස්ථානය - 10<br>iii. තෙවන ස්ථානය/වෙනත් කුසලතා - 08<br><br><u>කණ්ඩායම්</u><br>i. ප්‍රථම ස්ථානය/ හොඳම කුසලතාව - 10<br>ii. දෙවන ස්ථානය - 08<br>iii. තෙවන ස්ථානය/වෙනත් කුසලතා - 06 | 12 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF -3 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක් හෝ රජයේ පුහුණු ආයතනයකින්/ රජයේ පුහුණු ආයතනයකට අනුබද්ධ ආයතනයකින් අවම වශයෙන් අධ්‍යයන පැය 1500ක පාඨමාලාවක් හදාරා ලබාගත් ඉංග්‍රීසි භාෂාව සඳහා වූ ඩිප්ලෝමාවක්. | 10 | |
| | (ඈ) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී (දේශීය හෝ ලන්ඩන්) ඉංග්‍රීසි භාෂාව සඳහා අවම වශයෙන් අධි සාමාර්ථයක් ලබා තිබීම හෝ IELTS සමස්ථ ලකුණ 6.5 හෝ ඊට ඉහළ, TOEFL- IBT 79 හෝ ඊට ඉහළ, TOEFL-CBT 213 හෝ ඊට ඉහළ හෝ TOEFL-PBT 550 හෝ ඊට ඉහළ වීම. | 08 | |
| | (ඉ) විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් උසස් සහතික පත්‍රයක් හෝ වෙනත් ආයතනයකින් ඉංග්‍රීසි භාෂාව සඳහා ලබාගත් SLQF 2 මට්ටමේ සහතිකයක්.<br><br>*(ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)* | 05 | |
| 04 | **තොරතුරු තාක්ෂණය/ තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම** | | **10** |
| | (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක උපාධියක් සඳහා තොරතුරු තාක්ෂණය හෝ පරිගණක විද්‍යාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා තිබීම. | 10 | |
| | (ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයෙන් හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයකින් ලබාගත් තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීතිය පිළිබඳ ඩිප්ලෝමාවක්. | 08 | |
| | (ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හෝ වෙනත් ආයතනයකින් ලබාගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ NVQ-5 හෝ ඊට ඉහළ මට්ටමේ ඩිප්ලෝමාවක්. | 05 | |
| | (ඈ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ හෝ වෙනත් රජය පිළිගත් වෘත්තීය ආයතනයක තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නීති ක්ෂේත්‍රයේ පාඨමාලා හදාරා/ පුහුණු වැඩසටහන්වලට සහභාගී වී ලබාගත් සහතික පත්‍ර. (එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික දෙකකට ලකුණු ලබාදෙනු ලැබේ.)<br>*(ඉහළම සුදුසුකම සඳහා පමණක් ලකුණු ලබාදෙනු ලැබේ.)* | 04 | |

| *අනු. අංකය* | *විෂයය* | *ලකුණු* | *උපරිම ලකුණු* |
|---|---|---|---|
| 05 | **සම්මුඛ පරීක්ෂණයේ දී දක්වන කුසලතාව :**<br><br>තනතුරෙහි භූමිකාව ඉටුකිරීමට උපස්ථම්භවන අයදුම්කරුගේ:<br>✓ ශක්තීන් (Strength Questions)<br>✓ අවස්ථානුකූලව තීරණ ගැනීමේ හැකියාව ( Situational Questions) හා<br>✓ දක්ෂතාව (Competency questions)<br><br>*ඇගයීමට ලක් කිරීම අරමුණු කර ගත් ප්‍රශ්නවලට ලබාදෙන පිළිතුරු අනුව ලකුණු පිරිනමනු ලැබේ.* | <br><br><br>02<br>03<br>10 | **15** |
| | **එකතුව** | | **100** |

8. *අපේක්ෂකයින්ගේ අනන්‍යතාවය:*

යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන්නේ සෑම ආකාරයකින්ම සම්පූර්ණ අයදුම්පත් ඉදිරිපත් කර ඇති අපේක්ෂකයින් පමණි. සම්මුඛ පරීක්ෂණයේදී සියලුම සහතික පත්‍රවල මුල් පිටපත් හා අයදුම්කරු විසින්ම නිසි පරිදි සහතික කරන ලද පිටපත් ඉදිරිපත් කළ යුතුය.

සම්මුඛ පරීක්ෂණයේදී තමන්ගේ අනන්‍යතාවය සහතික කිරීම සඳහා පහත සඳහන් අනන්‍යතා පත්‍ර පිළිගනු ලැබේ.

i. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය.

9. *අයදුම්පත ඉදිරිපත් කළ යුතු ආකාරය:*

i. අයදුම්පත් 2026/10/30 වැනි දිනට හෝ ඊට ප්‍රථම ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව, අංක 42, ශ්‍රීමත් මාර්කස් ප්‍රනාන්දු මාවත, කොළඹ 07 යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් ඉදිරිපත් කිරීම හෝ අතින් ගෙනවිත් හෝ භාර දිය යුතු ය. එදිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

ii. අයදුම්පත බහාලන කවරයේ ඉහළ වම් කෙළවරේ "ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නීති නිලධාරී තනතුරට (විවෘත) බඳවා ගැනීම -2026" යනුවෙන් සඳහන් කළ යුතු ය.

iii. ඉදිරිපත් කළ යුතු අයදුම්පත්‍රයේ ආදර්ශ ආකෘති පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ දැක්වේ. අයදුම්කරුවන් ඔවුන්ගේ අයදුම්පත් A4 ප්‍රමාණයේ කඩදාසියක සකස් කර මුල් පිටුව අංක 01 සිට 03 දක්වාත් දෙවැනි පිටුව 04 සිට 06 දක්වාත් තෙවැනි පිටුව 07 සිට 10 දක්වාත් වන ආකාරයෙන් පිළියෙළ කර තමාගේ අත්අකුරින් සම්පූර්ණ කළ යුතු ය.

iv. අයදුම්පත්‍රයේ අපේක්ෂකයාගේ අත්සන රජයේ පාසලක විදුහල්පතිවරයෙකු / සාමදාන විනිශ්චයකාරවරයෙකු / දිවුරුම් කොමසාරිස්වරයෙකු/ නීතිඥවරයෙකු / ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු/ ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධරයෙකු හෝ රු.82,150/- ක හෝ ඊට වැඩි මාසික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු විසින් සහතික කළ යුතු ය.

v. දැනට රාජ්‍ය සේවයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් තම අයදුම්පත්, තමන් සේවය කරන දෙපාර්තමේන්තුවේ දෙපාර්තමේන්තු ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතු ය.

vi. මේ සමඟ ඇති ආදර්ශ අයදුම්පත්‍රයේ ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලැබේ.

vii. අවසාන දිනය දක්වා අයදුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳදරා ගත යුතු ය.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

10. *සාවද්‍ය තොරතුරු සැපයීම:*

ඔබ විසින් එවන ලද අයදුම්පත්‍රයේ සඳහන් කර ඇත්තාවූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණ වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ. එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

11. පුරප්පාඩු පිරවීමේ හෝ නොපිරවීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

12. මෙම ගැසට් නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් හෝ පරස්පරතාවයක් හෝ ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු වන්නේ ය.

13. මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්වයක් ඇති වුවහොත් ඒ පිළිබඳ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ලේකම්,
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය.

2026 සැප්තැම්බර් මස 18 වැනි දින,
කෘෂිකර්ම, පශුසම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය ,
අංක 80/5,
“ගොවිජන මන්දිරය”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.

**ආදර්ශ අයදුම්පත්‍රය**

***කෘෂිකර්ම,පශුසම්පත්,ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය යටතේ වන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026***

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

(අයදුම් කරන මාධ්‍යයට අදාළ අංකය කොටුව තුල ලියන්න.)

සිංහල -2/දෙමළ -3/ ඉංග්‍රීසි -4

***සටහන:-*** අයදුම් කරනු ලබන මාධ්‍යය පසුව වෙනස් කළ නොහැක.

1.0

1.1 සම්පූර්ණ නම (මයා/මිය/මෙය) : ..........................................................................................................
(සිංහලෙන්/දෙමළෙන්) ..........................................................................................................

1.2 සම්පූර්ණ නම : ..........................................................................................................
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) ..........................................................................................................

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

1.3 මුලකුරු සමග නම (මයා/මිය/මෙය) (සිංහලෙන්/දෙමළෙන්) : ........................................
........................................

උදා- එම්.ජී.බී.එස්.කේ.ගුණවර්ධන : ........................................
........................................

(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ........................................
උදා- GUNAWARDHANA, M.G.B.S.K ........................................

2.0

2.1 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) : ........................................
........................................

2.2 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ........................................
........................................

2.3 සම්මුඛ පරීක්ෂණයට කැඳවීමේ ලිපි එවිය යුතු ලිපිනය :........................................
........................................

3.0

3.1 ස්ත්‍රී /පුරුෂ භාවය: පුරුෂ - 0 ☐ (අදාළ කොටුව තුළ ලියන්න.)
ස්ත්‍රී - 1

3.2 විවාහක/ අවිවාහක බව: විවාහක -1 ☐ (අදාළ කොටුව තුළ ලියන්න.)
අවිවාහක -2

3.3 උපන් දිනය :

වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය ☐☐

3.4 2026/10/30 දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

4.0 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

5.0 දුරකථන අංකය : ස්ථාවර : ☐☐☐☐☐☐☐☐☐☐

ජංගම : ☐☐☐☐☐☐☐☐☐☐

6.0

6.1 සම්මුඛ පරීක්ෂණය සඳහා අයදුම් කිරීමට අයදුම්පත් කැඳවීමේ නිවේදනයට අනුව ලබාගෙන ඇති සුදුසුකම් පිළිබඳ විස්තර:

| සුදුසුකම් ලබාගත් ආයතනය | ලබාගත් දිනය |
|---|---|
| ........................................ | ........................................ |
| ........................................ | ........................................ |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරයෙකු වශයෙන් දිව්රුම් දුන් දිනය:……………………………………..

මූලික සුදුසුකම් සනාථ කෙරෙන සහතික/ ලේඛන අයදුම්කරු විසින්ම සත්‍ය බවට සහතික කර අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 07 යටතේ වූ එක් එක් සුදුසුකම් ලබා ගැනීමට අදාළ විස්තර:

6.2 අතිරේක අධ්‍යාපන සුදුසුකම්: ……………………………………………………………………………......
……………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………...

6.3 අතිරේක වෘත්තීය පළපුරුද්ද :...........................................................................................................
.......................................................................................................................................................
......................................................................................................................................................

6.4 තොරතුරු තාක්ෂණය/තොරතුරු තාක්ෂණ නීතිය පිළිබඳ දැනුම:…………………………………………………..
……………………………………………………………………………………………………………
…………………………………………………………………………………………………

6.5 භාෂා හැකියාව :…………………………………………………………………………………………………
………………………………………………………………………………………………………………

*අතිරේක සුදුසුකම් සනාථ කෙරෙන ලේඛන අයදුම්පත හා එවිය යුතු නොවන අතර, එම ලේඛන සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කිරීමට සුදානම් කර තබා ගැනීම අයදුම්කරුගේ වගකීමකි.

7.0 ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේද ? (අදාළ කොටුවේ ලකුණ (√) යොදන්න) ඔව් නම් විස්තර කරන්න.

| ඔව් | | නැත | |
|---|---|---|---|

.......................................................................................................................................................
.......................................................................................................................................................

8.0 *අයදුම්කරුගේ සහතිකය:*

මෙම අයදුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවත් සියලුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බවත්, මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත්වන බව මා දන්නා බවත්, සියලු නීතිරීති වලට මම යටත් වන බවත් ප්‍රකාශ කරමි.

දිනය:.................................... ....................................,
අයදුම්කරුගේ අත්සන.

9.0 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම:*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ......................................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද ඔහු/ඇය මා ඉදිරිපිට දී.......................................................................දින ඔහුගේ / ඇයගේ අත්සන තැබූ බවද සහතික කරමි.

දිනය:.................................... ........................................................,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

සම්පූර්ණ නම : ……………………………………………………………………………………………
තනතුර : ……………………………………………………………………………………………...
ලිපිනය: ……………………………………………………………………………………………
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

10.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය: (රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.)
ඉහත විස්තර සඳහන් ................................................................ මහතා/ මහත්මිය/මෙනවිය දැනට මෙම ආයතනයේ සේවය කරන බවත්, ඔහු/ ඇය විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවත්, වැඩ හා පැමිණීම සතුටුදායක බවත්, ඔහුට/ ඇයට විරුද්ධව කිසිඳු චෝදනාවක් නොවන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කළ හැකි/ නොහැකි බවත් සහතික කරමි.

.................................................. ..................................................,
දිනය දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.

සම්පූර්ණ නම : ……………………………………………………………………………………………
තනතුර : ………………………………………………………………………………………………...
ලිපිනය: ………………………………………………………………………………………………
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

09 - 344

---

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය**

අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ පහත තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* |
|---|---|
| 01. **මධ්‍යම කළමනාකාර ( MM 1-1)** | |
| 01.01 **නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (පළාත්)** | **03** |
| **02. කණිෂ්ඨ කළමනාකරණ තනතුරු (JM 1-1)** | |
| 2.01 **විද්‍යාත්මක නිලධාරි** | **06** |
| **03. බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරි තනතුරු (MA 5-2)** | |
| **3.01 සහකාර විද්‍යාත්මක නිලධාරි** | **02** |

01. **තනතුරු නාමය - නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (පළාත්)**
**සේවා ගණය - මධ්‍යම කළමනාකාර - (MM 1-1)**
**පුරප්පාඩු ගණන -03**

**01.01 සුදුසුකම්**

**01.1.1 බාහිර අයදුම්කරුවන්**

සමාජ විද්‍යාව/ මනෝ විද්‍යාව/ අපරාධ විද්‍යාව/ සමාජවැඩ යන විෂය ක්ෂේත්‍රයකින් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, උපාධියක් ලබා තිබීම;

*සහ*

ඉහත සඳහන් උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 01ක පළපුරුද්දක් ලබා තිබීම.

**01.1.2 අභ්‍යන්තර අයදුම්කරුවන් (පහත 1 හෝ 2)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම;

*හෝ*

2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කණිෂ්ඨ කළමනාකරණ (JM) සේවා ගණයෙහි අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**01.02 වයස:-**

**අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර 45 ට නොවැඩි විය යුතු ය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.**

**01.3. වැටුප් කේත අංකය -** MM 1-1
**01.4. මාසික වැටුප් පරිමාණය** - 2025.03.25 දිනැති ක.සේ.ච. 01/2025 MM 1-1-2025
රු.( MM 1-1 රු. (91,690 - 10 x 2,480 - 15 x 3,450 - රු.168,240)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

**02. තනතුරු නාමය - විද්‍යාත්මක නිලධාරි**
**සේවා ගණය - කණිෂ්ඨ කළමනාකාර - (JM 1-1)**
**පුරප්පාඩු ගණන - 06**

**02.01සුදුසුකම්**

**02.1.1 බාහිර අයදුම්කරුවන්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව පිළිබඳ විශේෂවේදී උපාධියක් ලබා තිබීම.

**02.1.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත 1 හෝ 2 හෝ 3)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. බලාත්මක කිරීමේ/ක්‍රියාත්මක කිරීමේ/ව්‍යාප්ති සේවා ගණයෙහි (MA 5-2) අදාළ ක්ෂේත්‍රයේ තනතුරක (සහකාර විද්‍යාත්මක නිලධාරි) අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.
3. කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි (MA 2-1) II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ තනතුරක (රසායනාගාර තාක්ෂණික ශිල්පී) අවම වශයෙන් වසර 05 ක සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**02.2. වයස**
අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**02.3. වැටුප් කේත අංකය -** JM 1-1
**02.4. මාසික වැටුප් පරිමාණය** - 2025.03.25 දිනැති ක.සේ.ච. 01/2025 JM 1-1-2025
රු.(72,650 - 10 x 1,360 - 18 x 2,040 - 122,970/-)
(වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

**03.1. තනතුරු නාමය -** සහකාර විද්‍යාත්මක නිලධාරි **සේවා ගණය - බලාත්මක කිරීමේ/ ක්‍රියාත්මක කිරීමේ/ ව්‍යාප්ති නිලධාරි** (MA 5-2)
**පුරප්පාඩු ගණන -** 02

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**03.1.1. සුදුසුකම්**

**03.1.1.1. බාහිර අයදුම්කරුවන් සඳහා සුදුසුකම්**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත්, රසායන විද්‍යාව හෝ තනතුරට අදාළ විෂය ක්ෂේත්‍රයේ වෙනත් උපාධියක් ලබා තිබීම.

**03.1.1.2. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා සුදුසුකම් (පහත 01 හෝ 02)**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික සේවා ගණයෙහි (MA 2-1) (රසයනාගාර තාක්ෂණික ශිල්පී) අදාළ ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම.

**03.1.2. වයස**

අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපායි.

**03.1.3. වැටුප් කේත අංකය -** MA 5-2

**03.1.4. මාසික වැටුප් පරිමාණය** - 2025.03.25 දිනැති ක.සේ.ව. අංක 01/2025 MA 5-2 රු.(62,310 - 10 x 1,360 - 15 x 1,670 - 5 x 2,040 - 111,160/-) (වැටුපට අමතරව රජයේ අනුමත දීමනා හා වරප්‍රසාද හිමිවේ)

<u>මෙම තනතුරු සඳහා පොදු කරුණු :</u>

සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු අතර, තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටුකිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට සුදුසු කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු යි.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයකින්ම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය.**

<u>අයදුම්පත් ඉදිරිපත් කිරීමේ මාධ්‍යය</u>

සෑම අයදුම්කරුවෙකුම ඉංග්‍රීසි මාධ්‍යයෙන් පමණක් තම අයදුම්පත් සම්පූර්ණ කළ යුතු ය. අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලයේ නිල වෙබ් අඩවිය වන www.nddcb.gov.lk වෙත පිවිස, "**වෘත්තීන්**" (https://www.nddcb.gov.lk/sinhala/careers.php) හි දක්වා ඇති උපදෙස් පරිදි අයදුම්පත සම්පූර්ණ කර **Submit Application** කිරීමෙන් අනතුරුව එහි පිටපත බාගත කර, එම දෘඩ පිටපතට මුදල් ගෙවූ රිසිට්පතෙහි මුල් පිටපත අමුණා ලියාපදිංචි තැපැල ඔස්සේ යොමු කළ යුතු ය.

<u>බඳවාගැනීමේ ක්‍රමවේදය</u>

බඳවාගැනීම් බලධාරියා විසින් තීරණය කරනු ලබන පරිදි ලිඛිත තරග විභාගයක හා/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

<u>පත්වීමේ ස්වභාවය</u>

ස්ථිර, සේවක අර්ථ සාධක අරමුදලට හා සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල් සඳහා හිමිකම් සහිත ය.

<u>අයදුම්පත් ගාස්තුව</u>

බාහිර අයදුම්කරුවන් පමණක් අයදුම්පත් ගාස්තුව වශයෙන් රු.500ක මුදලක් ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් "අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය" නමින් ලංකා බැංකුවේ ආයතනික ශාඛාව (Corporate Branch) අංක 00001643 යටතේ පවත්වාගෙන යන ගිණුමට බැර කර, මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතක් ඔබ ළඟ තබාගෙන එහි මුල් පිටපත (Deposit slip) අයදුම්පතට අමුණා එවිය යුතු ය. අයදුම්පත් ගාස්තුව නැවත ගෙවනු නොලැබේ.

බාගත කරන ලද අයදුම්පත (කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර පැහැදිලිව සටහන් කර) අදාළ සහතිකවල පිටපත් සමග **2026.10.16** වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් "සභාපති, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, 383, කෝට්ටේ පාර, රාජගිරිය" යන ලිපිනයට ලැබීමට සලස්වන්න. රජයේ සංස්ථා හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවයේ නියුතු සේවකයින් තම අයදුම්පත් ආයතන /දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් යොමු කළ යුතු ය.

**අයදුම්පත් භාරගන්නා අවසන් දිනට නියමිත සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් / අසම්පූර්ණ අයදුම්පත්/ මුදල් තැන්පතු පත්‍රිකාවේ මුල් පිටපත අමුණා නොමැති අයදුම්පත්/ බාගත (Downloaded Application) අයදුම්පත හැර යොමු කරන ලද වෙනත් අයදුම්පත් හා අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

**බඳවාගැනීම් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.**

**සභාපති,**
**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය.**

**ප්‍රකාශිත දිනය : 2026 සැප්තැම්බර් මස 25 වැනි දින,**

**අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය ,**
**383, කෝට්ටේ පාර,**
**රාජගිරිය.**

09 - 347

**සංශෝධනයයි**

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය**

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි (විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ) තනතුර සඳහා විවෘත පදනම මත බඳවා ගැනීම - 2026

මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ නීති නිලධාරී තනතුරට විවෘත පදනමින් බඳවා ගැනීම සම්බන්ධව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2477 දරන හා 2026.02.20 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද *ගැසට්* නිවේදනයේ 8(i) වගන්තියේ සඳහන් අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026.10.09 දින දක්වා දීර්ඝ කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභාව නියෝග කර ඇති බව එහි නියමය පරිදි කාරුණිකව දන්වමි.

ඉහත සංශෝධනය තුළින් මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය වන සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනය වන 2026.03.20 දිනය වෙනස් නොවන බවත් මීට පෙර අයදුම් කරන ලද අයදුම්කරුවන් නැවත අයදුම් කිරීමට අවශ්‍ය නොවන බවත් වැඩිදුරටත් දන්වා සිටිමි.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

කේ. ඒ. විමලේන්තිරරාජා,
ලේකම්,
වෙළෙඳ, වාණිජ , ආහාර සුරක්ෂිතතා සහ
සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය'

වෙළෙඳ, වාණිජ , ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය,
අංක 492, ආර්. ඒ. ද මැල් මාවත,
කොළඹ 03.

09 - 348

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු පර්යේෂණ නිලධාරි හා පර්යේෂණ නිලධාරි තනතුරුවලට පත් කිරීම සඳහා වන තරඟ විභාගය - 2026

දැනට පුරප්පාඩු වී ඇති පශු පර්යේෂණ නිලධාරි තනතුරු 12ක් හා පර්යේෂණ නිලධාරි තනතුරු 03ක් සඳහා පහත දැක්වෙන සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ නිලධාරීන්ගෙන් තරග විභාගය සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

01. බඳවා ගැනීමේ සුදුසුකම් :

1. *පශු පර්යේෂණ නිලධාරි :*

i. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරියෙකු ලෙස අවම වසර එක (01)ක හා උපරිම වසර තුන (03)ක ස්ථිර සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය පළමු පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) සාමාර්ථයක් සහිත වීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන ප්‍රකාරව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

iii. පූර්වාසන්න වසරවල වැටුප් වර්ධක උපයාගෙන තිබීම. (සටහන : මෙවරට පමණක් 2016 වර්ෂයේ පත්වීම් ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරීන්ට පශු පර්යේෂණ නිලධාරී තනතුර සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.)

2. *පර්යේෂණ නිලධාරි :-*

i. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරියෙකු හෝ සත්ත්ව පාලන නිලධාරියෙකු ලෙස අවම වසර එක (01) ක හා උපරිම වසර තුන (03) ක සතුටුදායක, ස්ථිර සේව කාලයක් සම්පූර්ණ කර තිබීම හා අදාළ පශු වෛද්‍ය විද්‍යාව/ සත්ත්ව පාලන විද්‍යාව/ කෘෂිකර්ම විද්‍යාව පිළිබඳ සිව් අවුරුදු උපාධිය පළමු පෙළ හෝ දෙවන පෙළ (ඉහළ) සාමාර්ථයක් සහිතව වීම.

ii. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හි විධිවිධාන ප්‍රකාරව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම.

iii. පූර්වාසන්න වසරවල වැටුප් වර්ධක උපයාගෙන තිබීම.

(*සටහන :* මෙවරට පමණක් 2016 වර්ෂයේ පත්වීම් ලද ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු වෛද්‍ය නිලධාරින්ට සහ සත්ත්ව පාලන නිලධාරින්ට පර්යේෂණ නිලධාරි තනතුර සඳහා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.)

02. ඔබ මෙම තනතුරු සඳහා ඉල්ලුම් කිරීමට අපේක්ෂා කරන්නේ නම්, මේ සමග අමුණා ඇති ආදර්ශ අයදුම් පත්‍රය සම්පූර්ණ කර **2026.10.26** දිනට පෙර "සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ.පෙ. :13, පේරාදෙණිය" යන ලිපිනය වෙත ලියාපදිංචි තැපෑලෙන් යොමු කළ යුතු ය. ආදර්ශ අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 01 සිට 06 දක්වා තොරතුරු පළමු පිටුවටත්, අනෙකුත් ශීර්ෂ පිළිවෙලින් අනෙක් පිටුවටත් ඇතුළත් වන සේ A4 ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්ත භාවිතා කරමින් අයදුම්පත්‍රය සකස් කළ යුතු ය. නිවේදනයේ දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්‍ර හා අසම්පූර්ණ අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත්‍රය බහාලනු ලබන ලියුම් කවරයේ වම් පස ඉහළ කෙළවරේ "ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු පර්යේෂණ නිලධාරි හා පර්යේෂණ නිලධාරි තනතුරුවලට පත් කිරීම සඳහා වන තරග විභාගය - 2026" ලෙස සඳහන් කළ යුතු වේ.

03. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ලිඛිත තරග විභාගය පවත්වනු ලබන අතර විභාගය සඳහා අපේක්ෂකයාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය ඉදිරිපත් කළ යුතු ය. අපේක්ෂකයන් විසින් රු. 1,000/=ක් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධාන කාර්යාලයේ සරප් වෙත හෝ පහත ගිණුම් අංකය වෙත හෝ බැරවන ලෙස දිවයිනේ ඕනෑම **මහජන බැංකු ශාඛාවකට** මුදල් ගෙවා ලබාගන්නා ලදුපත හෝ ලදුපතෙහි පැහැදිළි පිටපතක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුදල් භාරගනු නොලබන අතර විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු නොකෙරේ.

ගිණුම් හිමියාගේ නම : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්
බැංකුව : මහජන බැංකුව, පේරාදෙණිය ශාඛාව
ගිණුම් අංකය : 057-100179027275

04. විභාගය සඳහා ප්‍රවේශපත්‍ර නිකුත් කළ පසු අයදුම්කරුවෙකු වෙත ප්‍රවේශපත්‍ර නොලැබුණු අවස්ථාවකදී අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ පිටපත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව වෙත යොමු කර විමසීමක් කළ යුතු ය. සෑම විභාග අපේක්ෂකයෙකුම නියමිත විභාග ශාලාවට අදාළ ප්‍රවේශපත්‍රයෙහි අත්සන සහතික කරවාගෙන පළමුවෙන්ම එම ශාලාවේ පෙනී සිටින දින එහි ශාලාධිපති වෙත භාරදිය යුතුය. විභාග පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් විය යුතුය.

05. විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පමණක් මහනුවර නගරයේ දී පවත්වනු ලැබේ.

06. ලිඛිත තරග විභාගයේදී ලබාගන්නා කුසලතාව පදනම් කර බඳවා ගැනීම් සිදු කරනු ලැබේ. ප්‍රතිඵල මත පවතින පුරප්පාඩු අනුව වැඩිම ලකුණු ලබාගන්නා නිලධාරීන් කුසලතා අනුපිළිවෙල අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබේ. (විෂය නිර්දේශය අමුණුම 02 හි දැක්වේ).

07. තව ද, පශු පර්යේෂණ නිලධාරියෙකු ලෙස හෝ පර්යේෂණ නිලධාරියෙකු ලෙස උක්ත ලිඛිත විභාගයේ ප්‍රතිඵල මත පත්වීම් ලද පසු නැවත පශු වෛද්‍ය නිලධාරි/ සත්ත්ව පාලන නිලධාරි තනතුරු සඳහා පත් කරනු ලැබීමට අවස්ථාවක් නොමැත.

රාජ්‍ය සේවා කොමිෂන් සභා නියමය පරිදි,

ලේකම්,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
දිනය : 2026 සැප්තැම්බර් මස 17 වැනි දින.

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු පර්යේෂණ නිලධාරි හා පර්යේෂණ නිලධාරි තනතුරුවලට පත් කිරීම සඳහා වන තරග විභාගය - 2026**

**APPLICATION FOR RECRUITMENT OF OFFICERS IN THE POST OF VETRINARY RESEARCH OFFICERS AND RESERCH OFFICERS IN THE SRI LANKA ANIMAL PRODUCTION AND HEALTH SERVICE - 2026**

[ ]
(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

ලිඛිත තරග විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යය:
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4 [ ] (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

තනතුරු සඳහා ඉල්ලුම් කරන ආකාරය - [ ]
(පශු පර්යේෂණ නිලධාරි - 01)
(පර්යේෂණ නිලධාරි - 02)
(තනතුරු දෙකම නම් - 03)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

01. (I) සම්පූර්ණ නම (මයා/මිය/මෙය) (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.....................................................................................................................................
(උදා : HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

(II) අගට යෙදෙන නම මුලින් ද, අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :
.....................................................................................................................................
(උදා : GUNAWARDHANA, H.M.S.K.)

(II) සම්පූර්ණ නම (සිංහලෙන් / දෙමළෙන්) :
..............................................................................................................................................

2.0 වර්තමාන සේවා ස්ථානය හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : ..........................................................................

3.0 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

4.0 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 ☐ (අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ස්ත්‍රී - 1

05. උපන් දිනය : වර්ෂය : ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

06. දැනට දරන තනතුර : ..............................................................................................................................

07. ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ මුල් පත්වීමේ දිනය : ..............................................................

08. I. පත්වීම ස්ථිර කර ඇත්නම් ස්ථිර කළ දිනය : ..........................................................................................

II. සේවා කාලය : ..............................................................................................................................

09. සේවා විස්තරය :

| *දැනට දරන තනතුර* | *සේවා කාලය* | | *සේවා ස්ථානය* | *දෙපාර්තමේන්තුව/ පළාත් සභාව* |
|---|---|---|---|---|
| | *සිට* | *දක්වා* | | |
| | | | | |

10. ලබා ඇති උපාධි පිළිබඳ විස්තර :

| *සමත් වූ උපාධිය/ පශ්චාත් උපාධි සුදුසුකම්* | *පන්තිය* | *විශ්වවිද්‍යාලය* | *වර්ෂය* |
|---|---|---|---|
| 1.<br>2.<br>3. | | | |

11. අයදුම්පත් කැඳවන අවසාන දිනට පූර්වාසන්න වසරවල වැටුප් වර්ධක උපයාගෙන ඇති බව:

| *අනු අංකය* | *වර්ෂය* | *වැටුප් වර්ධක උපයාගෙන ඇති / නැති බව* |
|---|---|---|
| | | |

12. I. විනය ක්‍රියාමාර්ග කිසිවක් ගෙන තිබේ ද? .........................................................................................

II. විනය දඬුවම්වලට භාජනය වී ඇත්නම් ඒ පිළිබඳ දින වකවානු සහිත විස්තර :
..............................................................................................................................................
..............................................................................................................................................

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

13. විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තරය :

I. විභාග ගාස්තු ගෙවූ බැංකු ශාඛාව : ..................................................................................................................
II. ලදුපත් අංකය : ..................................................................................................................
II. දිනය : ..................................................................................................................

ලදුපත නොගැලවෙන සේ එහි එක් දාරයකින් මෙහි අලවන්න

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මවිසින් ඉදිරිපත් කරනු ලබන තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත්, බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරුවලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි හෝ බව මා තෝරා ගැනීමට පෙර දැනගතහොත්, මා තනතුර සඳහා නුසුදුස්සෙකු වීමට යටත් වන බවත්, පත් කිරීමෙන් පසුව ඒ බව දැනගතහොත් මා කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් මම දැන සිටිමි. මම කිසිදු උසාවියකින් සාපරාධී වරදකට වැරදිකරුවෙකු වී නොමැති බව ද මගේ සුදුරුදු අත්සන තබා මින් සහතික කරමි. තව ද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

දිනය : ...................................... ..................................................,
අයදුම්කරුගේ අත්සන.

***දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :***

ඉහත අයදුම්කරු වූ ........................................................................... මහතා/ මිය/ මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ .... ................................... පළාත් සභාවේ .................................................. තනතුරක සේවය කරන බවත්, ඉල්ලුම්පත්‍රයේ සඳහන් තොරතුරු ඔහුගේ / ඇයගේ පෞද්ගලික ලිපිගොනුව අනුව නිවැරදි බවත් සහතික කරමි. මෙම තනතුර සඳහා මෙම නිලධාරියා තේරී පත්වුවහොත් ඔහු/ ඇය මෙම දෙපාර්තමේන්තුවෙන්/ පළාත් රාජ්‍ය සේවයෙන් මුදා හැරීමට හැකි/ නොහැකි බවත් දන්වමි. (අදාළ නොවන වචන කපා හරින්න)

දිනය : ...................................... ..................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව)

**ශ්‍රී ලංකා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය සේවයේ පශු පර්යේෂණ නිලධාරි හා පර්යේෂණ නිලධාරි**
තනතුරුවලට පත් කිරීම සඳහා වන තරග විභාගය - 2026

01. විභාගය පිළිබඳ විස්තර :

| *ප්‍රශ්න පත්‍ර අංකය* | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රය | පැය 02 | 100 | 50 * |
| 02 | අභියෝග්‍යතා පරීක්ෂණය | පැය 01 | 100 | 50 * |

* අදාළ පුරප්පාඩු සංඛ්‍යාවට වඩා සමත් වීමේ අවම ලකුණු ප්‍රමාණය ලබාගත් නිලධාරීන් ප්‍රමාණය අඩු වූ අවස්ථාවක දී ලබා ගත යුතු සමත් වීමේ අවම ලකුණු ප්‍රමාණය අඩු කිරීමට පත්වීම් බලධාරියාට හැකියාව ඇත.

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

02. විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂයය නිර්දේශය |
|---|---|
| 01. පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ දැනුම මැන බැලීම සඳහා වන ප්‍රශ්න පත්‍රය | 1. ශ්‍රී ලංකාවේ විද්‍යා සහ පර්යේෂණ පරිසරය, ශ්‍රී ලංකාවේ ජාතික පර්යේෂණ ප්‍රතිපත්තිය, කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්තිය, පර්යේෂණ කටයුතු සඳහා මුදල් වෙන් කිරීම්, පර්යේෂණ කටයුතුවල නියැලී සිටින ජාතික ආයතන, පර්යේෂණ ප්‍රමුඛතා<br>2. පර්යේෂණ නාමකරණය, පර්යේෂණ වර්ග, මූලික සකස් කරගත හැකි සහ අදාළ වූ පර්යේෂණ<br>3. පර්යේෂණ අවශ්‍යතා - හඳුනාගැනීම සහ විශ්ලේෂණ අවශ්‍ය වීම, හඳුනාගැනීමේ ක්‍රමවේදයන් සහ විශ්ලේෂණ ක්‍රමවේදයන් ප්‍රමුඛත්වය දීම<br>4. පර්යේෂණ සැකසීම, නියැදීම් ශිල්පීය ක්‍රම, නියැදි ප්‍රමාණය, පරීක්ෂා කිරීම් ක්‍රම, ස්ථාන තේරීමේ දී සලකා බැලිය යුතු කරුණු, අත්හදා බැලීම්, කයි ක්‍රමය, තර්කානුසාරී දළ සැලැස්ම යොදා ගැනීම, 'සියල්ල හෝ නැත' යන න්‍යාය<br>5. පර්යේෂණයන් පිළිබඳ සොයා බැලීම, ජාත්‍යන්තර සහ ජාතික පර්යේෂණ ප්‍රකාශය, සඟරා, තොරතුරු සොයා බැලීම, පුස්තකාල ජාල<br>6. පර්යේෂණ සම්බන්ධ සංඛ්‍යා ලේඛන, සංඛ්‍යා ලේඛන සහ දත්ත විශ්ලේෂණ පැකේජ සහ මෘදුකාංග, මූලික ගණනය කිරීම්, ඓක්‍යය, සාමාන්‍ය, සම්මත විචලනය, සම්බන්ධතා සංගුණකය, සම්මත බෙදා හැරීමේ වක්‍රය යොදා ගැනීම<br>7. ලේඛනගත කිරීම, පර්යේෂණ තීරණ ප්‍රකාශන, පර්යේෂණ ප්‍රකාශන සඳහා සම්මත ආකෘති පත්‍රය, ලිවීමේ දී අනුගමනය කරන්නා වූ නියමයන් ලුහුඬින් දැක්වීම් හි ඇති ප්‍රයෝජන ඒවායේ සාපේක්ෂ වාසිදායක හා අවාසිදායක වීම් සමග විවිධ ඉදිරිපත් කිරීම්<br>8. පර්යේෂණ සහ දියුණු කිරීම් - පර්යේෂණ සහ ව්‍යාප්තිය අතර පරතරය, පර්යේෂණ, ව්‍යාපෘති ප්‍රතිබද්ධයන්, පර්යේෂණ තීරණ බෙදා හැරීම, පශ්චාත් පර්යේෂණ සම්බන්ධතා<br>9. පර්යේෂණයන්ගේ ආචාර ධර්ම, වෙනත් මූලාශ්‍රයන්ගෙන් තොරතුරු ලබා ගැනීම, ප්‍රකාශයට පත් නොකළ දත්ත යොදා ගැනීම, පර්යේෂණ කටයුතු සඳහා යොදා ගැනීම<br>• ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය. |
| 02. අභියෝග්‍යතා පරීක්ෂණ | අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත්, විශ්ලේෂණ තත්ත්වයත්, තීරණ ගැනීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ බහුවර්ණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් යුක්ත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.) |

**රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

කම්කරු අමාත්‍යාංශය

**කම්කරු දෙපාර්තමේන්තුව**

***කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුර සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2026***

කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ 2024.12.31 දිනට පවතින සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරුවල පුරප්පාඩු 09 ක් සීමිත ධාරාව යටතේ පිරවීම සඳහා පහත සුදුසුකම්ලත් මෙම දෙපාර්තමේන්තුවේ 2026.10.23 දිනට සක්‍රීය සේවයේ නියුතු I ශ්‍රේණියේ කම්කරු නිලධාරින්ගෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ “Our Services” යටතේ ඇති “Online Application – Recruitment Exams/ E.B. Exams” ඔස්සේ පළකර ඇති අතර, අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 සැප්තැම්බර් මස 28 වැනි දින පෙ.ව. 09.00ට විවෘත වන අතර 2026 ඔක්තෝබර් මස 23 වැනි දින රාත්‍රී 09.00ට අවසන් වේ. මෙම විභාගය 2026 දෙසැම්බර් මස පැවැත්වේ/ විභාගය පවත්වන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.**

නිලධාරින් අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපි ගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානීන් වෙත භාර දිය යුතු අතර සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලබන අවස්ථාවේ දී ආයතන ප්‍රධානියා විසින් සහතික කළ අයදුම්පතේ පිටපතක් සහ සේවය සනාථ කිරීමේ ලිපියක් ඉදිරිපත් කළ යුතු ය.

**01. සේවයට බඳවා ගැනීමේ ක්‍රමය:**

ලිඛිත විභාගය සමත් වූ අයදුම්කරුවන් වෙනුවෙන් පමණක් සේවා කාලය සඳහා ලකුණු ලබා දෙන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන අතර, ලිඛිත විභාගය සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා ලබා ගන්නා ලකුණුවල එකතුව අනුව උපරිම ලකුණු ලබාගන්නා අපේක්ෂකයන් පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගනු ලැබේ.

තව ද, ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු, බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම, රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන අවස්ථාවේදී පරීක්ෂා කරනු ලැබේ. ඒ සඳහා ලකුණු ලබා දෙනු නොලැබේ.

පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාව තීරණය කරනු ලබන දිනයක් වනු ඇත.

**02. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි :**

i. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තව ද, ඔබ වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට/ වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක විය යුතුය. රජය මගින් විටින් විට නියම කරනු ලබන ආකාරයට ඔබ විසින් ඒ සඳහා දායක මුදල් ගෙවිය යුතු ය.

ii. මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරින් එක් අවුරුදු පරිවාස කාලයකට යටත් වේ.

iii. අංක 18/2020 හා 2020.10.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි හා ආනුෂංගික චක්‍රලේඛවල සඳහන් විධිවිධාන අනුව, නියමිත අනෙක් රාජ්‍ය භාෂාවේ/ රාජ්‍ය භාෂාවල ප්‍රවීණතාව ලබා ගත යුතු ය.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමත කර ඇති අංක PSC/EST/2/1/33/2/2/2012 හා 2013.03.07 දිනැති කම්කරු දෙපාර්තමේන්තුවේ විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පටිපාටියේ පනවා ඇති නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීමේ පටිපාටියට කර ඇති හෝ මින් මතු කෙරෙන සංශෝධනවලට ද රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලට ද ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට ද රජයේ මුදල් රෙගුලාසිවලට ද දෙපාර්තමේන්තුගත අනෙකුත් නියෝගවලට ද මෙම පත්වීම යටත් වේ.

v. විධායක සේවා ගණයේ III ශ්‍රේණියේ සහකාර කම්කරු කොමසාරිස් (දෙපාර්තමේන්තුමය) තනතුරට පත් වී වසර තුනක් (03) ගතවීමට පෙර බඳවා ගැනීමේ පටිපාටිය අනුව පළමු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතු ය.

vi. ඉල්ලුම් කරනු ලබන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලබන අතර, ඔබ පත්වීම

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

ලැබීමට සුදුසුකම්ලත් භාෂා මාධ්‍යය වනුයේ, ඔබ විසින් අයදුම්පතේ සඳහන් කරනු ලබන භාෂා මාධ්‍යය වේ.

**03. වැටුප් පරිමාණය:**

අංක 10/2025 දරන 2025.03.25 දිනැති රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛයේ විධි විධාන අනුව මෙම පත්වීමට හිමි මාසික වැටුප් පරිමාණය රු. 82,150- 10x2,400– 8x2,940– 17x3,900- රු.195,970/= (SL-1-2025) වේ. එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එහි උපලේඛන III හි සඳහන් පරිදි වේ.

**04. සුදුසුකම්:**

**4.1. අධ්‍යාපන සුදුසුකම් :**

I ශ්‍රේණියේ කම්කරු නිලධාරින් අතරින් බඳවා ගනු ලබන බැවින් අදාළ නොවේ.

**4.2. වෘත්තීය සුදුසුකම්:**

අදාළ නොවේ.

**4.3. පළපුරුද්ද :**

කම්කරු නිලධාරි තනතුරේ වසර 10 ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම සහ I ශ්‍රේණියේ කම්කරු නිලධාරියකු වීම.

**4.4. කායික සුදුසුකම්:**

සෑම අපේක්ෂකයකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවෙන් යුක්ත විය යුතු ය.

**4.5. වෙනත් සුදුසුකම්:**

- ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
- අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
- සෑම අයදුම්කරුවකුම කම්කරු නිලධාරි තනතුරේ ස්ථිර කර තිබීම.
- සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්නතම වසර පහ (05) ක කාලසීමාව තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් ලබා තිබීම.
- සුදුසුකම් සපුරා තිබිය යුතු දිනට පූර්වාසන්නතම වසර පහ (05) ක කාලසීමාව තුළ සියලුම වැටුප් වර්ධන උපයාගෙන තිබීම.
- නියමිත කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණ සම්පූර්ණ කර තිබීම.
- රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 සහ එහි සංශෝධනයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබිය යුතු ය.
- අයදුම්පත් කැඳවන අවසන් දිනට, බඳවා ගැනීමේ පරිපාටියේ සඳහන් කර ඇති සියලුම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

**4.6. වයස් සීමාව:**

අදාළ නොවේ.

**05. ලිඛිත විභාගය :**

5.1. විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් මෙම විභාගය පවත්වනු ලැබේ.

5.2. විභාගය භාෂා ත්‍රිත්වයෙන්ම පවත්වනු ලැබේ. අයදුම්කරන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

5.3. ලිඛිත විභාගය පහත සඳහන් ප්‍රශ්න පත්‍රවලින් සමන්විත වේ.

| | *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු* |
|---|---|---|---|---|
| 01 | කම්කරු නීති | පැය 03 | 100 | 40% |
| 02 | සාමාන්‍ය බුද්ධිය | පැය 01 | 100 | 40% |
| 03 | කළමනාකරණ අභියෝග්‍යතාව | පැය 02 | 100 | 40% |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

5.4. විභාගය සඳහා අදාළ වන විෂය නිර්දේශය

| | ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|---|
| 01 | කම්කරු නීති | එය පහත සඳහන් අණපනත් අළලා සකස්වනු ඇත.<br>1941 අංක 27 දරන පඩිපාලක සභා ආඥාපනත<br>1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත<br>1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත<br>1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ විශේෂ විධිවිධාන පනත<br>1935 අංක 14 දරන වෘත්තීය සමිති ආඥාපනත<br>1942 අංක 45 දරන කර්මාන්තශාලා ආඥාපනත<br>1956 අංක 47 දරන ස්ත්‍රීන්, තරුණ අය සහ ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ පනත<br>1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනත<br>1939 අංක 32 දරන ප්‍රසූතිකාධාර ආඥාපනත<br>1985 අංක 21 දරන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශ පනත<br>1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පිළිබඳ පනත<br>1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් මණ්ඩල පනත |
| 02 | සාමාන්‍ය බුද්ධිය | පද, සංඛ්‍යාත්මක සහ රූපාකාර සංදර්භයක් තුළ ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් අයදුම්කරුගේ නිගමනයන් සහ ප්‍රතිචාරයන් පරීක්ෂා කිරීම තුළින් අයදුම්කරුගේ අවබෝධ කර ගැනීමේ ශක්තිය සහ බුද්ධිය මැනීම මෙයින් අපේක්ෂා කෙරේ. |
| 03 | කළමනාකරණ අභියෝගතාව | ගැටලු හා ඒවාට හේතු හඳුනා ගැනීම, තීරණ ගැනීම, අන්තර් පුද්ගල සම්බන්ධතා පැවැත්වීම, සන්නිවේදන කුසලතාව, ස්වයං විනය, ප්‍රතිපත්ති හා උපාය මාර්ග සකස් කිරීම යනාදී වශයෙන් අපේක්ෂකයකු සතු විශිෂ්ට කළමනාකරණ කුසලතාවන් ඔහුට යොමු කරනු ලබන සිද්ධි හා ප්‍රස්තාවයන් අනුසාරයෙන් නිර්ණය කිරීම මෙයින් අපේක්ෂා කෙරේ. |

**06.** **ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය :**

6.1. සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත්කරනු ලබයි.
6.2. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන් පමණක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබයි.
6.3. ලිඛිත විභාගයේ දී සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණු ප්‍රමාණයේ එකතුව අනුව ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් පුරප්පාඩු සංඛ්‍යාව මත බඳවා ගනු ලැබේ.

| ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂය | උපරිම ලකුණු | තෝරා ගැනීමට සලකා බලන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| අතිරේක පළපුරුද්ද :<br>ඉහත අනු අංක 4.3 යටතේ සඳහන් මූලික සුදුසුකමට අමතරව වන සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සඳහා ලකුණු ලබා දෙනු ලැබේ. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2019 හා එහි සංශෝධනයන්හි විධිවිධාන අනුව, අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දීමේ දී වැඩිම සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සහිත නිලධාරියාට මුළු ලකුණු ලබා දෙන අතර, සෙසු නිලධාරීන්ට සමානුපාතික ලෙස අමතර සේවා කාලය සඳහා ලකුණු ලබා දීම ද සිදු කරනු ලබයි. (මාස 06 හෝ ඊට වැඩි සේවා කාලයක් සඳහා පමණක් ලකුණු ලබා දෙනු ලැබේ) | 100 | අදාළ නොවේ |
| **එකතුව** | **100** | |

**07. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය :**

ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු - බඳවා ගැනීමේ පටිපාටිය හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම හා කායික යෝග්‍යතාව පරීක්ෂා කිරීම, ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය පවත්වන අවස්ථාවේදී ම සිදු කරනු ලැබේ.

***සැලකිය යුතු යි:*** සම්මුඛ පරීක්ෂණවලට සහභාගී වීම, පත්වීම් පිරිනැමීමට සුදුසුකම් සම්පූර්ණ කිරීමක් සේ සලකනු නොලැබේ.

**08. විභාග කොන්දේසි :**

8.1 අපේක්ෂකයන් කැමති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයකුම ප්‍රශ්න පත්‍ර තුනට (03) ම පෙනී සිටිය යුතු ය.

8.2 විභාග ගාස්තුව රු 1,200/-කි. විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම් සිදු කළ යුතු ය.

8.2.1 ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින් (Any Bank Credit Card);

8.2.2 අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින් (Any Bank Debit Card with the Facility of Internet Transactions);

8.2.3 ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය/ Flex යෙදවුම මගින් (Online Banking Method of Bank of Ceylon/ Flex App);

8.2.4 ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින් (Any Branch of the Bank of Ceylon);

***සටහන :***

I. ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරනු ලබන ආකාරය පිළිබඳ උපදෙස් විභාග දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ මෙම විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

II. ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේදී සිදු වන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

III. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

8.3 මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතු ය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව / භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

8.4 විභාග නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළ වන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව සඳහන් කරමින් වෙබ් නිවේදනයක් මගින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මගින් දන්වනු ලැබේ. තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් දැන්වීමේ සඳහන් පරිදි විද්‍යුත් තැපැල් මගින් ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතු ය. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

8.5 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල් සතු වේ.

8.6 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

8.7 අපේක්ෂකයන්ගේ අනන්‍යතාව - විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේදී තම අනන්‍යතාව ඔප්පු කර තිබිය යුතු ය. පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

8.7.1 ජාතික හැඳුනුම්පත,
8.7.2 වලංගු විදේශ ගමන් බලපත්‍රය,
8.7.3 වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කර ගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපකරණ පැළඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු ය.

***සැලකිය යුතු ය :***

(අ) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

(ආ) ලියවිලි ඉදිරිපත් කරන ලෙස දන්වන අවස්ථාවකදී අදාළ ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් ගැන සලකා බලනු නොලැබේ.

(ඇ) විභාගයට පෙනී සිටීමට පෙර සෑම අයදුම්කරුවකුම ප්‍රවේශ පත්‍රයේ තම අත්සන සහතික කරවා ගැනීම අනිවාර්ය වන අතර, එය තමා සේවය කරන අංශයේ/ කාර්යාලයේ ප්‍රධානියා ලවා සිදු කරවා ගත යුතු ය.

(ඈ) පත්වීම සඳහා සුදුසුකම් ලබන යම් අයදුම්කරුවකු එම පත්වීම පිරිනමන අවස්ථාවේ දී බලපවත්වන රෙගුලාසි හා විධිවිධාන යටතේ පත්වීම් ලැබීමට සුදුසුකම් ලැබී නැතැයි සලකනු ලැබුවහොත් හෝ අසතුටුදායක වැඩ හැසිරීම කරණ කොටගෙන හෝ මෙම පත්වීම නොදීමේ අයිතිය රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.

**09.** රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති, කලින් කලට රාජ්‍ය සේවය සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ හා 2013-03-07 දිනැතිව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත විධායක සේවා ගණය සඳහා වන බඳවා ගැනීමේ පරිපාටියේ නියමයන් හා කොන්දේසිවලට ද එම බඳවා ගැනීමේ පටිපාටියේ මින් මතු කෙරෙන සංශෝධන ද මෙම තනතුර සඳහා අදාළ වනු ඇත.

**10. සාවද්‍ය තොරතුරු සැපයීම :**

ඔබ විසින් එවන ලද අයදුම්පතේ සඳහන් කර ඇත්තා වූ යම් තොරතුරක් අසත්‍ය හෝ වැරදි බව බඳවා ගැනීමට පෙර අනාවරණය වුවහොත් ඔබගේ අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

එබඳු අසත්‍ය හෝ වැරදි තොරතුරක් බඳවා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් ඊට අදාළ ක්‍රියාමාර්ගයන්ට යටත්ව ඕනෑම අවස්ථාවක සේවයෙන් පහ කිරීමට කටයුතු කරනු ලැබේ.

❖ කිසියම් පුරප්පාඩු සංඛ්‍යාවක් හෝ පුරප්පාඩු සියල්ලම පිරවීම හෝ නොපිරවීම හෝ අර්ධ වශයෙන් පිරවීම හෝ මෙම රෙගුලාසිවල සඳහන් කර නොමැති යම් කරුණු පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ඇත.

**11.** සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍යය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

**12.** මෙම නිවේදනයේ සඳහන් නොවන කරුණක් සම්බන්ධයෙන් හෝ මෙම බඳවා ගැනීමේ ක්‍රියාමාර්ගය තුළ කිසියම් ගැටළුකාරී තත්වයක් ඇතිවුවහොත් ඒ පිළිබඳව රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ලබන තීරණ අවසාන තීරණ වේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**එස්. එම්. පියතිස්ස,**
ලේකම්,
කම්කරු අමාත්‍යාංශය

2026, සැප්තැම්බර් මස 14,
කම්කරු අමාත්‍යාංශය,
7 වන මහල, "මෙහෙවර පියෙස",
නාරාහේන්පිට,
කොළඹ 05.

09 - 236

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

## අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරීන් සඳහා වන II වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය - 2026 (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් සහ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට පත් කරනු ලැබූ නිලධාරීන් විසින් විභාගය සඳහා පෙනී සිටිය යුතු ය.)

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ II ශ්‍රේණියේ නිලධාරීන් හා අංක අමප/21/1824/308/139 සහ 2021.11.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අංක අමප/12/1101/530/035 සහ 2012.08.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 2 පන්තියේ II ශ්‍රේණියට අධි සේවක පදනම මත පත් කරනු ලැබූ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් විභාගය **2027 ජනවාරි මස** කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.doenets.lk වෙබ් අඩවියේ "Our Services" (අපගේ සේවා) යටතේ ඇති "Online Applications – Recruitment/EB Exams" (මාර්ගගත අයදුම්පත් (බඳවාගැනීම්/කාර්යක්ෂමතා කඩඉම් විභාග) ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 සැප්තැම්බර් මස 28 වැනි දින පෙ.ව. 09.00**ට විවෘත වන අතර **2026 ඔක්තෝබර් මස 26 වැනි දින ප.ව. 09.00**ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 1885/31 දරන 2014.10.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා විභාග පටිපාටිය (වගුව 01) හා විෂය නිර්දේශය (වගුව 02) පහත දක්වා ඇත.

**(අ) විභාග පටිපාටිය (වගුව 01)**

| *විෂය අංකය* | *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු* |
|---|---|---|---|---|
| 01 | පාසල් පරිපාලනය හා අධීක්ෂණය | පැය 03 | 100 | 40 |
| 02 | පාසල් සැලසුම්කරණය | පැය 03 | 100 | 40 |
| 03 | අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර | පැය 03 | 100 | 40 |

**(ආ) විෂය නිර්දේශය (වගුව 02)**

| *විෂය අංකය* | *විෂයය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | **පාසල් පරිපාලනය හා අධීක්ෂණය** | පාසලක යහපාලනය සඳහා විදුහල්පතිවරයකුගේ කාර්යභාරය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කෙරේ. පාසල් කළමනාකරණ ක්‍රමවේද, කාලසටහන් සැකසීම, වගකීම් බෙදා දීම, පාසල් සංවර්ධනය සඳහා ජනතා සහභාගීත්වය, පාසල් පාදක කළමනාකරණය, පාසල් පාදක ගුරු සංවර්ධනය, ගුරු සුභසාධනය, ශිෂ්‍ය හිතකාමී පාසල් සංකල්පය, ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපනය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ. |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *විෂය අංකය* | *විෂයය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 02 | **පාසල් සැලසුම්කරණය** | සංවර්ධනයේ නියමුවකු වශයෙන් විදුහල්පතිවරයකුගේ කාර්යභාරය පිළිබඳව අපේක්ෂකයන්ගේ දැනුම හා අවබෝධය පරීක්ෂා කිරීම සඳහා ප්‍රශ්න ඇතුළත් කරනු ලැබේ. පාසල් කළමනාකරණ මණ්ඩල, පාසලක දැක්ම හා මෙහෙවර, පාසල් තොරතුරු පාදක සැකසීම, සංයුක්ත සැලසුම්, දීර්ඝකාලීන හා කෙටි කාලීන සැලසුම්, වාර්ෂික ක්‍රියාත්මක සැලසුම්, පාසල් ජාල හා සම්පත් සැලසුම් කිරීම, ප්‍රාදේශීය සංවර්ධනයට පාසලේ දායකත්වය යන ක්ෂේත්‍ර පිළිබඳ දැනුම මැන බැලේ. |
| 03 | **අධ්‍යාපනයේ නව ප්‍රවණතා හා ව්‍යවහාර** | ඉගෙනීම හා ඉගැන්වීම් පිළිබඳ නව සංකල්පය, අත්දැකීමෙන් ඉගෙනීම, තර්කානුකූල චින්තනය, අධ්‍යාපනයේ සමතාව, විශේෂ අවශ්‍යතා ඇති අය සඳහා අධ්‍යාපනය, නොවිධිමත් අධ්‍යාපනය, වැඩිහිටි අධ්‍යාපනය, යාවජීව අධ්‍යාපනය, නිපුණතා පාදක අධ්‍යාපනය, ජීවත්වීම සඳහා අධ්‍යාපනය, ශිෂ්‍ය උපදේශන හා වෘත්තීයමය මාර්ගෝපදේශනය යන විෂය කරුණු පිළිබඳ දැනුම මැන බැලේ. |

03. **විභාගයේ භාෂා මාධ්‍යය :-**

සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

04. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. ඒ අනුව එම ප්‍රතිඵල www.moe.gov.lk යන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ඇත. විභාග අපේක්ෂකයන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

05. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකතන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ.යු.* - අයදුම්කරු විසින් තම පෞද්ගලික තොරතුරු අයදුම්පතට ඇතුළත් කර අයදුම්පත සම්පූර්ණ කිරීමේදී ඉතා සැලකිලිමත් විය යුතු අතර ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව නම, ජාතික හැඳුනුම්පත් අංකය, ලිපිනය ඇතුළු කිසිදු තොරතුරක් සංශෝධනය සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත් තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා අදාළ නම් විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා, අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතු ය. විභාග ශාලාවේදී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

07. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු යි. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර විභාග දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු යි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළැඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු යි.

09. විභාග ගාස්තු :

(අ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.

(ආ) ඊට පසු එක් එක් විභාග වාරය සඳහා අය කෙරෙන ගාස්තු පහත පරිදි වේ.

එක් විෂයයක් සඳහා : රු. 250/-

(ඇ) විභාග ගාස්තු ගෙවීමේ දී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින්;
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්;
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම මගින්;
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්.

(ඈ) ඉහත ක්‍රම මගින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ඉ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මගින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මගින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඊ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

10. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

11. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

12. මෙම නිවේදනය මගින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

**නාලක කලුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 සැප්තැම්බර් මස 21 දින,
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

09 - 338/1

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

**අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් සඳහා වන I වන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය - 2026 (ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් සහ අධිසේවක පදනම මත ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියට පත් කරනු ලැබූ නිලධාරින් විභාගය සඳහා පෙනී සිටිය යුතු වේ.)

අංක 1885/31 හා 2014.10.22 දිනැති ශ්‍රී ලංකා විදුහල්පති සේවා ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ III ශ්‍රේණියේ නිලධාරින් හා අංක අමප/21/1824/308/139 සහ 2021.11.23 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, අංක අමප/12/1101/530/035 සහ 2012.08.08 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ 3 පන්තියට අධි සේවක පදනම මත පත් කරනු ලැබූ නිලධාරින් සඳහා වන කාර්යක්‍ෂමතා කඩඉම් විභාගය **2027 පෙබරවාරි මස** කොළඹ දී පැවැත්වෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

අයදුම්පත ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ **www.doenets.lk** වෙබ් අඩවියේ “Our Services” (අපගේ සේවා) යටතේ ඇති “Online Applications – Recruitment/EB Exams” (මාර්ගගත අයදුම්පත් (බඳවාගැනීම්/කාර්යක්ෂමතා කඩඉම් විභාග) ඔස්සේ පළ කර ඇති අතර අයදුම්පත් ඉදිරිපත් කළ හැක්කේ මාර්ගගත ක්‍රමයට (Online) පමණි. මාර්ගගත අයදුම්පත් භාර ගැනීම **2026 සැප්තැම්බර් මස 28 වැනි දින පෙ.ව. 09.00**ට විවෘත වන අතර **2026 ඔක්තෝබර් මස 26 වැනි දින ප.ව. 09.00**ට අවසන් වේ. අයදුම්පත මාර්ගගතව යොමු කළ පසු එය බාගත කර මුද්‍රිත පිටපතෙහි අදාළ කොටස් අත් අකුරින් පුරවා අයදුම්කරුගේ අත්සන සහතික කර, අයදුම්පතේ පිටපතක් තම පෞද්ගලික ලිපිගොනුවට ඇතුළත් කිරීම සඳහා ආයතන ප්‍රධානියා වෙත භාරදිය යුතු ය.

අයදුම්පත් යොමු කිරීම අවසාන දිනය දක්වා ප්‍රමාද කිරීමෙන් ඇති වන ඕනෑම අහිතකර තත්ත්වයක් අයදුම්කරු විසින් විඳ දරාගත යුතු ය.

02. මෙම විභාගයට අදාළ විෂය නිර්දේශය හා අනෙකුත් විධිවිධාන අංක 2454/54 දරන 2025.09.18 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළ කර ඇත. අයදුම්කරුවන්ගේ පහසුව සඳහා විභාග පටිපාටිය (වගුව 01) හා විෂය නිර්දේශය (වගුව 02) පහත දක්වා ඇත.

**(අ) විභාග පටිපාටිය (වගුව 01)**

| *විෂය අංකය* | *විෂයය* | *කාලය* | *ලකුණු* | *සමත් වීමට අවශ්‍ය අවම ලකුණු* |
|---|---|---|---|---|
| 01 | **ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති** | පැය 2 | 100 | 40 |
| 02 | **පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි** | පැය 2 | 100 | 40 |
| 03 | **සන්ධාන භාෂාව (ඉංග්‍රීසි)** | පැය 3 | 100 | 40 |

**(ආ) විෂය නිර්දේශය (වගුව 02)**

| *විෂය අංකය* | *විෂයය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 01 | **ආයතන සංග්‍රහයේ විධිවිධාන හා රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති** | ආයතන සංග්‍රහයේ VII,VIII,IX,X, XI, XXIII, XXV, XXVI, XXVII, XXVIII ,XXIX, XXX, XXXI, XXXII, XXXIII, XLVII, XLVIII, යන පරිච්ඡේද හා අංක 2310/29 හා 2022.12.14 දිනැතිව *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති පිළිබඳ දැනුම පරීක්ෂා කරනු ලැබේ. |
| 02 | **පාසල්වල මුදල් පරිපාලනය හා මුදල් රෙගුලාසි** | අයවැය ඇස්තමේන්තු මුදල් පාලනය හා මූල්‍ය වගකීම් පැවරීම, මුදල් භාර ගැනීම ගිණුම්ගත කිරීම හා ප්‍රතිග්‍රහණය, ගෙවීම්, රාජ්‍ය මුදල් භාරකාරත්වය, අග්‍රිම හා බැංකු ගිණුම්, වැඩ හා සේවා, භාණ්ඩ සමීක්ෂණ, විගණන විමසුම්, රජයේ කාර්යාලවල භාවිත වන ලෙජර්, ආදායම් හා වියදම් සාරාංශ, බැංකු සැසඳුම්, නොගෙවූ චෙතන, රාජකාරි දුරකථන පිළිබඳව නිකුත් කර ඇති චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි පිළිබඳ සාමාන්‍ය අවබෝධය පරීක්ෂා කෙරේ. |

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

| *විෂය අංකය* | *විෂයය* | *විෂය නිර්දේශය* |
|---|---|---|
| 03 | සන්ධාන භාෂාව (ඉංග්‍රීසි) | Suitable level of proficiency on the following forms of grammar in the written language is expected from the candidate: -<br>- Tenses and Numbers<br>- Sentences (Simple/Compound/Complex/Compound Complex)<br>- Relative Clauses<br>- Reported Speech<br>- Adjectives and Adverbs<br>- Determiners<br>- Prepositions<br>The knowledge on the modern formats and styles of writing is tested in following area of study: -<br>- Summary writing<br>- Report writing<br>- Essay writing |

03. **විභාගයේ භාෂා මාධ්‍යය :-**

(i) විෂය අංක 01 හා 02 විෂයයන් සිංහල හා දෙමළ මාධ්‍යයෙන් පැවැත්වේ. අපේක්ෂකයන් කැමති එක් මාධ්‍යයකින් පමණක් විභාගයට පෙනී සිටිය යුතු ය. අපේක්ෂකයකුට ස්වකීය අයදුම්පතේ දැක්වෙන විභාග මාධ්‍යය වෙනස් කිරීමට අවසර නොමැත.

(ii) විෂය අංක 03 ට අදාළ සන්ධාන භාෂා පරීක්ෂණය ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පැවැත්වේ.

04. විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන්ගේ ප්‍රතිඵල ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදෙනු ඇත. ඒ අනුව එම ප්‍රතිඵල www.moe.gov.lk යන අමාත්‍යාංශ වෙබ් අඩවියේ පළ කරනු ඇත. විභාග අපේක්ෂකයන් වෙත පෞද්ගලික ප්‍රතිඵල ලේඛන නිකුත් කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු නොකරනු ඇත.

05. මාර්ගගත (Online) විභාග අයදුම්පත ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සම්පූර්ණ කළ යුතුය. අයදුම්කරු විසින් මාර්ගගතව යොමු කරන ලද මෘදු පිටපත වලංගු අයදුම්පතක් බවට දෙපාර්තමේන්තුව විසින් භාර ගන්නා ලද බව/ භාර නොගන්නා බව පද්ධතියට ප්‍රවේශ වීමට භාවිත කරන ලද ජංගම දුරකථන අංකයට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් (E-mail) ලිපිනයට හෝ දැනුම් දෙනු ලැබේ. මාර්ගගත අයදුම්පත සම්පූර්ණ කිරීමට පෙර විභාගය සඳහා අයදුම් කිරීම වෙනුවෙන් සකසා ඇති උපදෙස් පත්‍රිකාව (Instructions) බාගත කර ගන්න. අයදුම්පත පිරවීමේ දී එම උපදෙස් නිවැරදිව පිළිපදින්න. අයදුම්පතේ මුද්‍රිත පිටපතක් ලබා ගැනීමෙන් පසුව එහි සිදු කරනු ලබන කිසිදු සංශෝධනයක් වලංගු සංශෝධනයක් ලෙස සලකනු නොලැබේ. අසම්පූර්ණ අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සැ.යු.* - අයදුම්කරු විසින් තම පෞද්ගලික තොරතුරු අයදුම්පතට ඇතුළත් කර අයදුම්පත සම්පූර්ණ කිරීමේදී ඉතා සැලකිලිමත් විය යුතු අතර ප්‍රතිඵල නිකුත් කිරීමෙන් අනතුරුව නම, ජාතික හැඳුනුම්පත් අංකය, ලිපිනය ඇතුළු කිසිදු තොරතුරක් සංශෝධනය සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

06. *ගැසට්* නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කර ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර මාර්ගගතව පමණක් නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් ඒ බව වෙබ් නිවේදනයක් මඟින් / අයදුම්කරුවන් වෙත කෙටි පණිවුඩයක් මඟින් දන්වනු ලැබේ. ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයකු වේ නම් වෙබ් නිවේදනයේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ ආයතනික විභාග සංවිධාන ශාඛාවෙන් විමසිය යුතු ය. එසේ විමසීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ ඉල්ලීම් ලිපියක් වෙබ් නිවේදනයේ සඳහන් විද්‍යුත්

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED

තැපැල් ලිපිනය වෙත යොමු කර විමසා සිටීම වඩාත් ඵලදායී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පතේ ඡායා පිටපත හා අදාළ නම් විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි ඡායා පිටපත සූදානමින් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ප්‍රවේශ පත්‍රය පරීක්ෂා කර බලා සංශෝධන වෙතොත් කල් වේලා ඇතිව විභාග දෙපාර්තමේන්තුව අමතා, අයදුම්පතට අනුව අදාළ සංශෝධන සිදු කර ගත යුතුය. විභාග ශාලාවේ දී සංශෝධන සඳහා කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

07. විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ අයදුම්කරුගේ අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියකු ලවා සහතික කර තිබිය යුතු යි. අපේක්ෂකයකු තමාට නියම කර ඇති විභාග ශාලාවේ දී නියමිත විභාග අංකය යටතේ විභාගයට පෙනී සිටිය යුතු අතර, විභාගයේ පළමු වැනි දින තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත භාරදිය යුතු යි. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

08. විභාග අපේක්ෂකයන් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම ශාලාධිපති සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ තුළ යුතු ය. ඒ සඳහා පහත දැක්වෙන ලේඛන පමණක් වලංගු වේ.

i. ජාතික හැඳුනුම්පත,
ii. වලංගු විදේශ ගමන් බලපත්‍රය,
iii. වලංගු ශ්‍රී ලාංකික රියදුරු බලපත්‍රය.

එමෙන්ම විභාග අපේක්ෂකයන් අනන්‍යතාව තහවුරු කරගත හැකි වන පරිදි මුහුණ ආවරණය කිරීමෙන් තොරව හා විද්‍යුත් සන්නිවේදන උපාංග පැළැඳගෙන නොමැති බව තහවුරු කර ගත හැකි වන පරිදි දෙකන් ආවරණය කිරීමෙන් තොරව විභාග ශාලාවට ඇතුළු විය යුතු ය. ඊට එකඟ නොවන අයදුම්කරුවන් විභාග ශාලාවට ඇතුළත් කර නොගැනේ. තව ද, විභාග ශාලාවට ඇතුළු වූ මොහොතේ සිට විභාගය අවසන් වී ඉන් පිටවන තෙක් මුහුණ හා දෙකන් ආවරණය කිරීමෙන් තොරව සිටිය යුතු යි.

09. විභාග ගාස්තු :

(අ) සම්පූර්ණ විභාගය හෝ ඉන් කොටසක් සඳහා හෝ පළමුවැනි වතාවේ දී ගාස්තු අයකරනු නොලැබේ.

(ආ) ඊට පසු එක් එක් විභාග වාරය සඳහා අය කෙරෙන ගාස්තු පහත පරිදි වේ.
එක් විෂයයක් සඳහා : රු. 250/-

(ඇ) විභාග ගාස්තු ගෙවීමේදී මාර්ගගත පද්ධතියෙන් ලබා දෙන පහත ගාස්තු ගෙවීමේ ක්‍රමවේද යටතේ පමණක් ගෙවීම සිදු කළ යුතු ය.

i. ඕනෑම බැංකු ණය කාඩ්පතක් මගින්;
ii. අන්තර්ජාල ගෙවීම් පහසුකම සහිත ඕනෑම බැංකු හර කාඩ්පතක් මගින්;
iii. ලංකා බැංකු මාර්ගගත බැංකු ක්‍රමය / Flex යෙදවුම මගින්;
iv. ඕනෑම ලංකා බැංකු ශාඛාවක් මගින්.

(ඈ) ඉහත ක්‍රම මඟින් ගෙවීම් සිදු කරන ආකාරය පිළිබඳ උපදෙස් වෙබ් අඩවියේ විභාගයට අදාළ තාක්ෂණික උපදෙස් යටතේ පළ කර ඇත.

(ඉ) ගෙවීම් ලැබුණු බවට කෙටි පණිවුඩයක් (SMS) මඟින් හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් මගින් හෝ දන්වනු ලැබේ. විභාග ගාස්තුව සඳහා වන සම්පූර්ණ මුදලම ගෙවිය යුතු වන අතර විභාග ගාස්තු අඩුවෙන් හෝ වැඩියෙන් ගෙවා ඇති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉහත සඳහන් ගෙවීම් ක්‍රම මඟින් විභාග ගාස්තු ගෙවීමේ දී සිදුවන දෝෂ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වග කියනු නොලැබේ.

(ඊ) විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවීමක් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් සිදු කරනු නොලැබේ.

10. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත. විභාග ප්‍රතිඵල සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

11. සිංහල, ඉංග්‍රීසි හා දෙමළ මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැළපීමක් හෝ අනනුකූලතාවක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

12. මෙම නිවේදනය මඟින් ආවරණය නොවන කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සතුය.

**නාලක කළුවැව,**
ලේකම්,
අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ
වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය.

2026 සැප්තැම්බර් මස 21 දින
පැලවත්ත, ඉසුරුපාය, අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

09 - 338/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED